HNB GRAMEEN
මෙහෙවර
අඳුර දුරලන සොඳුරු මෙහෙවර
2016 මැයි - ජූනි කලාපය

OPRAH NET WORTH

ඇයගේ උප්පැන්නයේ සඳහන් නම වූයේ ,ඕපාය. (Orpah), නමුත් බොහෝ අය ඇයව හැඳින්වූයේ ඔප්රා (Orpah) ලෙසයි. ඇය ඉපදුනේ ඇමරිකාවේ මිසිසිපි ප්‍රාන්තයේ ය. 1954 ජනවාරි 29 වන දා උපත ලැබූ ඇගේ මව විවාහ නොවූ ලම් කාන්තාවක් විය. එනම් ඇය විවාහක වයසේ පසු නොවීය. ඔප්රාගේ මවගේ නම වූයේ වර්මිතා ය. ඇය ගෘහ සේවිකාවක් ලෙස රැකියාව කළාය. ඇයගේ පියා වූයේ ,වර්මන්, නැමැත්තෙකි. ඔප්රාගේ මව රැකියාව සඳහා වෙනත් ප්‍රදේශයකට යද්දී ඇයගේ මවට දරුවාව භාර දී යන ලදී. ඔප්රාගේ පවුලේ අය ඉතාමත් දුප්පත් අය විය. ඇයගේ අත්තම්මා ඇයව වයස 3 දී අධ්‍යාපනය සඳහා පල්ලියට යොමු කළ අතර අදාල පාඩම් නොකළ විට ඇයට දැඩි දඬුවම් ලබා දුනි. ඇය ඔප්රා ගැන සොයා බැලුවාය. ඔප්රාට වයස 6 සම්පූර්ණ වන විට ඇයගේ මව දරුවාව ඇය ළඟට ගත්තා ය. ඇයගේ අත්තම්මා තරම් ඇගේ මව ඔප්රාව අධ්‍යාපනයට යොමු කිරීමට කැප වූයේ නැත. ඔප්රාගේ අධ්‍යාපනය ද සම්පූර්ණයෙන්ම අත්හැරිණි. මේ අතරතුර ඔප්රා තම මවගෙන් ඈත්විය.

ඉබාගාතේ හැණූ ඔප්රාට ඇයගේ මාමා කෙනෙක් සහ ඇයගේ දුර සහෝදරයෙක් වයස අවුරුදු 9 දී ඇයව හිංසනයන්ට ලක්කර ඇත. මෙම ලිංගික අඩන්තේට්ටම් ගැන ඇය ප්‍රසිද්ධ රූපවාහිනී වැඩසටහනක් 1986 දී ප්‍රකාශයට පත් කළා ය. නමුත් ඇයගේ මාමා සහ ඥාති සහෝදරයා එය ප්‍රතික්ෂේප කළේ බොරු බව පවසමිනි. වයස 13 දී ලිංගික වද හිංසා ඉවසා ගත නොහැකිව නිවසින් පලා ගිය ඔප්රා වයස 14 වන විට ගැබ්බර මවක් වී අඩු මාස ගණනකින් දරුවකු බිහි කළාය. ඉපදී සුළු වේලාවකින්ම බිළිදා මිය ගියේය.
දරුවාගේ මරණින් පසු ඔප්රා නැවත අධ්‍යාපනයට යොමු විය. දැඩි ආර්ථික ගැටළු හමුවේ ඇය අධ්‍යාපනය ලැබුවේ ඉතා දුක්බර ලෙසය .තම මවගේ මුදල් පවා ඇය සොරකම් කළාය. ඊට හේතු වූයේ ඇගේ මව අධ්‍යාපනයටවත් මුදල් නොදෙන නිසා යි.

ඇය මවට අකමැති වූ නිසා මව විසින් ඇයගේ තාත්තාට භාර දුනි. ඇයගේ පියා ඉතා සැර අයකු විය. එසේම ඔහු ඇයව අධ්‍යාපනයට ද යොමු කළ අතර ඇය පිළිබඳ නිතරතුරුවම සොයා බැලී ය. පාසලේ දී ඔප්රාව කථික කණ්ඩායමේ හොඳම ශිෂ්‍යාව ලෙස තෝරා ගන්නා ලදී. ඇය පාසලේ දී ජනප්‍රියම ශිෂ්‍යාව බවට ද පත්විනි. ඇය පසුව ජාතික මට්ටමෙන් පැවැත් වූ නාට්‍ය තරගයෙන් දෙවන ස්ථානය දිනා ගත්තා ය. ඇයගේ ව්‍යක්ත කථිකත්වය නිසා රජයේ විශ්ව විද්‍යාලයට ඇතුල් වීමට පූර්ණ ශිෂ්‍යත්වයක් හිමිවිය. ඇය එහි දී ,සන්නිවේදනය, උපාධිය සඳහා තෝරා ගන්නා ලදී.

ඔප්රා ඇගේ මවට නොව අත්තම්මාට දැඩි ලෙස ඇලුම් කළාය. එයට හේතු වූයේ අත්තම්මා ඇයට ඉගැන්වීමට දැරූ උත්සාහය සහ ඇය දැක්වූ ආදරය සහ කරුණාවයි. පසුව ඇයට රූපවාහිනී ආයතනයක ප්‍රවෘත්ති නිවේදිකාවක් වීමට ද අවස්ථාව ඇයගේ දක්ෂතාවය නිසාම උදා විය. ඇය ක්‍රමයෙන් රූපවාහිනී ආයතන කිහිපයකට ක්‍රමයෙන් මාරුවෙමින් තම දක්ෂතා ඔප මට්ටම් කර ගන්නා ලදී. ඇය 1983 දී වෙනත් රූපවාහිනී නාලිකාවකට නැවත සම්බන්ධ විය. ඇයට එහි දී පහළ ප්‍රේක්ෂක ප්‍රතිචාර පැවති වැඩසටහනක් භාරදුනි. එහි වැඩසටහන් නාමය වූයේ ,උදෑසන චිකාගෝ, ය. මුල්ම වැඩසටහන 1984 ජනවාරි 2 දින විකාශනය විය. ඇය මසකින් පසු එම රූපවාහිනී නාලිකාවේ පසුපසින්ම තිබූ වැඩසටහන එම නාලිකාවේ අංක එකේ වැඩසටහන බවට පත්කිරීමට සමත් විය. ඇය නිසා ආයතනයේ ආදායම 4 ගුණයකින් ඉහළ ගොස් ඇති බව ආයතනයේ පාලන අධිකාරිය ප්‍රකාශයට පත් කරන ලදී. ඉන්පසුව එම උදෑසන වැඩසටහනේ නාමය වෙනස් කර ඔප්රා වින්ෆ්‍රි ෂෝ (Opra winfrey show) ලෙස නම් කරන ලදී. පැය භාගයේ වැඩසටහන පැයක වැඩසටහනක් බවට පත් විය. එම කාලයේ දී ,ටයිම් සඟරාව, අතිශය සාර්ථක වැඩසටහන ලෙස ඔප්රාගේ වැඩසටහන නම් කරන ලදී. ටයිම් සඟරාව ඇයව දැඩිසේ වර්ණනා කර සඟරාවේ ලිපි පල කරන ලදී. ඇමරිකාවේ උදෑසන වැඩසටහන් බදු අරගෙන ඇත්තේ සුදු ජාතික කාන්තාවන් සහ පිරිමින් බවත් එම සියල්ලන්ම පරදවා කළු ජාතික ගැහැනියක් දහසක් අභියෝග මැද ජයගත් ආකාරය පැසසීමට ලක් කළාය. ඔප්රා 1993 දී සුවිශේෂී අවස්ථාවක් හිමි කර ගන්නා ලදී. එනම් මයිකල් ජැක්සන්ව සමුම්බ සාකච්ඡා වැඩසටහනකට සම්බන්ධ කර ගැනීමයි. එය ඇමරිකානු ඉතිහාසයේ වැඩිපුරම නැරඹූ වැඩසටහන ලෙස ඉතිහාසයට එක් කිරීමට ඇය සමත් විය. ඇය චිත්‍රපට නිෂ්පාදිකාවකි, ග්‍රන්ථ කතුවරියකි, රූපවාහිනී නාලිකාවක හිමිකාරිනියකි. ඇයගේ රූපවාහිනී නාලිකාවේ නාමය "OWN" එනම්, "Oprah Winfrey Network"

4 පිටුවට...

නිවේදිකාවක වීමට සිහින මැවූ කුණු කාණුවේ දැරිය....

ඇයගේ මුල්ම රැකියාව වූයේ සාමාන්‍ය කුඩා ග්‍රොසරියක සහකාරියක් ලෙස වැඩ කිරීමයි. ඇය අවුරුදු 17 දී කළු ජාතික කාන්තාවන් අතරින් රූප සුන්දරිය ලෙස විශ්ව විද්‍යාලයේ දී තේරුනි. ඇය කළු ජාතිකයින් නියෝජනය කරන රේඩියෝ ආයතනයක අර්ධ කාලීන රැකියාවක උපාධිය හදාරන අතර නිරත වූවා ය. ඇයගේ අත්තම්මා ඇයගේ ජනමාධ්‍ය රැකියාව ගැන පුදුම වූයේ නැත. එයට හේතුව වූයේ ඇය කුඩා කාලයේ වැටවල් උඩ සිටින කපුටන්ට පවා සම්මුඛ සාකච්ඡා තියනවා දැක තිබූ නිසාය.

ප්‍රේමසිරි ගමගේ
සභාපති, ව්‍යාපාර
සංවර්ධන කේන්ද්‍රය.

HNB GRAMEEN
මෙහෙවර 03
2016 මැයි - ජූනි

දැක්ම

සැබැවින්ම ඔබ වාසනාවන්තය

ආයතනයක කාර්ය මණ්ඩලය යනු එහි ජීවනාලියයි. ආයතනයක සාර්ථකත්වය සේවකයාගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීත්වය මත තීරණය වන්නාක් මෙන්ම සේවකයාගේ ජීවන තත්වය ආයතනයේ ස්ථාවරත්වය සහ කළමනාකාරිත්වයේ දැක්ම මත තීරණය වන්නේය. ඒ අනුව බලන කල **HNB** ග්‍රාමීන් සමාගමේ කාර්ය මණ්ඩල සාමාජිකයන් වූ ඔබ සැබවින්ම වාසනාවන්තය. මා එසේ කියන්නේ ඇයි....ඔබ ග්‍රාමීන් සමාගමෙහි බොහෝ දුෂ්කර කාල සීමාවන් පසුකොට අද වන විට එහි සාර්ථකත්වය අත්විඳින්නන් වන බැවිනි.

ගිම්හානයේ කටුකත්වය අත් නොවින්දෙකුට වසන්තයේ සුන්දරත්වය සැබෑ ලෙස අත්විඳිය නොහැකිවාක් මෙන් පසුගිය කාල පරාසය තුළ අප විඳි දුෂ්කරතා, බාධක, නින්දා අපහාස අත් විඳි ඔබ අද අප ලබා ඇති සාර්ථකත්වය , ජයග්‍රහන සහ ස්ථාවරත්වය පිළිබඳව මුළු හදවතින්ම සතුටු වන්නෝය. **HNB** බැංකුව වැනි ලංකාවේ පැරණිතම බැංකුවක ශක්තියත්, සහෝදරත්වයෙන් යුතුව තම කාර්ය මණ්ඩලයේ සුබ සිද්ධිය පිළිබඳව සංවේදීව විමසා බලන කළමනාකාරිත්වයක නායකත්වයත් ඔබට හිමිය.ඒ අනුව ඒ සියල්ලෙන් සුපෝෂණය වන පැහැදුල් අනාගතයක් ඔබට හිමිය.

ඒ අනාගත ගමන් මග තව තවත් සාර්ථක කර ගැනීම සඳහා ඔබ විසින් සපුරාලිය යුතු තවත් අවශ්‍යතා කිහිපයක් වේය යන්න මගේ අදහසයි. ඉන් එකක් වන්නේ ඔබගේ හැකියාවන් සහ දක්ෂතා තව තවත් ඔප මට්ටම් කර ගැනීම සඳහා උනන්දු වීමයි. නව තාක්ෂණික භාවිතාවන් සහ ඔබ නියැලි ක්ෂේත්‍රයට අදාල සහ ඉන් පරිබාහිර වූ අත්‍යාවශ්‍ය දැනුම ළඟා කර ගැනීමට උනන්දු වීම තුළින් ඉදිරියේදී රැකියාවෙන් ඉදිරියට යාමට ඔබට ලැබෙන අවස්ථා වැඩිය. ඒ සඳහා අප මානව සම්පත් අංශය මගින් ද ඔබ වෙත විශේෂ පුහුණු සහ පුහුණු අවස්ථා සලසා දීමට කටයුතු කරන්නෙමු.

එසේම දිගුකාලීනව එකම ආයතනයක රැඳී සිටීම තුළින් ඔබට ලැබෙන මූල්‍යමය හා මූල්‍යමය නොවන ප්‍රතිලාභ රැසකි. එතුළින් ඔබගේ සහ පවුලේ සාමාජිකයන්ගේ ජීවිත තව තවත් ආලෝකමත් කර ගත හැකිවාක් මෙන්ම රැකියාවේ ස්ථාවරත්වය හා පිළිගැනීම ද වර්ධනය කරගත හැකිය. එම කැපවීම ඔබ නොදැනුවත්වම ඔබගේ ජීවිතය උසස් සාර්ථකත්වයක් කරා රැගෙන යන ඉණිමඟක්ම වේ.

වසර ගණනක් පුරා **HNB** ග්‍රාමීන් සමාගමේ උන්නතිය වෙනුවෙන් ඔබ දක්වන ලද කැපවීම සහ වෙහෙස මහන්සිය සිය දහස් ගුණයකින් වර්ධනය වූ ඵලදාවක් සේ අද දවසේ ඔබ සහ ඔබ කුටුම්භය සමෘද්ධිය කරා රැගෙන යන බව මේ වන විටත් ඔබට පැහැදිලිය. එය තව තවත් වර්ධනය කර ගැනීමේ හැකියාව සහ ශක්තියද ඇත්තේ ඔබ තුළය. එකම පවුලක්සේ බැඳුණු අප ග්‍රාමීන් පවුල පෙර වූ කණ්ඩායම් හැඟීමෙන්ම ඉදිරියට රැගෙන යාමේ හැකියාවද ඇත්තේ ඔබ තුළය.එය එලෙසම රැකගන්න වෙහෙසෙන්න.

රුවන් ප්‍රනාන්දු
නියෝජ්‍ය සාමානාධිකාරී
මානව සම්පත් සහ පරිපාලන

ඇස

නැවතුණු තැන්

රිය සක හැසිරුණේ මහ මග මගෙ අණට වට පිට රියදුරන් බැණ අඩගැසුවේ මෙමට කඩුවෙල මහ මගේ ඔරු පැදවෙයි හැම අතට තොටියා රජ වෙලා ඇත අඳ මහ ජල කඳට

පොලිසිය, උසාවිය, සිග්නල් දඩ කොළය දෙන්නේ නොමැත අඳ දින සේවා මුරය එක්වී ඔබ සමග සටනක ඇති තෙක් ජවය සලසමි මෙහෙවරක් පරයා අඳුරැති ජලය

2015.05.19 දින එච් එන් බී ග්‍රාමීන් ගංවතුර සහන සේවා සලසන අතර තුර කඩුවෙල, බණ්ඩාර වත්ත මංසංදියේදී ඇස නැවතුනු අවස්ථාවක්...

පබැඳුම හා ඡායාරූපය - තිළිණ දිසානායක

ළමා සිත

පහන් තාරුව

ආසයි වතුරෙ පැන සෙල්ලම් කරන්නට
දෝතින් අරන් අහසට විසි කරන්නට
අම්මේ උම්මා දෙන්නම් ''හා'' කියන්නට
තාත්තට එපා ඇහුවොත් කියන්නට

ගහට නැගල ගෙඩියක් මම කඩන්නද
උම්මට භාගයක් ඒකෙන් කවන්නද
තාත්තා අහයි මම දැග කරනවද
කැළලකි පියාගේ උප්පත්තියෙන්මද....?

ආසයි පැණි රසට වරදක් නොම සිතමි
සඟවන තැන සීනි අම්මේ මම දුටිමි
ඔබෙන් ගුටි කකා දත් දෙපළම මදිමි
කළු වූ දතක් ඔබෙ උඩු ඇන්දේ දුටිමි

තෙලට කිරට රස ආහර මටම සඳයි
ගේ වට දුව දුවා ඒවා මටම කවයි
ගොඩක් නොකෑවොත් අම්මා ගහයි බනියි
අම්මේ එහෙම නම් ගෙම්බා නයිත් ගිලියි...

ජී .ඩී .සී ලලින්ද - ප්‍රධාන කාර්යාලය

කාලය

ජීවිතය ගමනකි
දැකිය හැකි ඔරලෝසුවෙන්
හොඳ නරක කටු
එකිනෙකා පසුකරන ....!
කාලය සාපේක්ෂයකි
එකින් එක මත රැඳෙන
නැවත ගත නොහැකි
අපට මග හැරෙන ....!
අවැසි මොහොතක් එදෙස
රඳවන්නට දෙනෙත
ඔරලෝසුවෙන් ගෙවෙන්නේ
කාලයම නොව
ජීවිතයද නොවෙද....!

වික්‍රම

දිරුපෙම

පිපී විකසිත විය පෙම් මල
දරා දරු සෙනෙහසේ මහිමය
නුඹේ මුල් හඩට අවධි වුණා
මගේ නෙත නිනැහුණා කඳුලට...
සදාතනික පෙම් පැතුම නුඹම විය

පෙරුම් පුරා රැකගත්තා නුඹව මම
ජීවිතේ දුක් ගැහැට අබියසද
ලොවක් දිනූ එක් මවක් විය මම...

සුසිත් මංගලා අධිකාරී

මතකය

පෙර එක දවසක ලස්සන සවසක
ඇස් දෙක විතරක් පිලින තියාගෙන
සත්තයි ඔබ කියූ ආදර කතාව
මගේ සිතේ මිය ගියා නොවේ.....

කවුරුත් එන්නැති සුන්දර ලෝකේ
කවුරුත් දන්නැති අනන්ත සෙනෙහස
සත්තයි ඔය ඇස් බලන් කියන්නට
බැරි මට ඔබ සිහි නොවුනා නොවේ

නුවන් කුමාර - ගල්ගමුව

නිතරම මට කළ හැකි බව සිතන්න

ගං වතුර අබිමුව උතුරා ගිය අපගේ මිනිසුන් කම

ඡායාරූප - තිළිණ දිසානායක,අසේනි ප්‍රනාන්දු

වෙසක් සිරියෙන් දසතම නැහැවෙද්දි ශ්‍රී ලාංකික බෞද්ධයන් හැමෝමත් ඒ වෙසක් අසිරිය පිළිගන්න බොහෝම උනන්දුවෙන් ලක ලැහැස්ති වුණා. ඒත් සිදු වුනේ ඒ වෙසක් අසිරියට කලින් පැමිණි බලාපොරොත්තු නොවූ අමුත්තකු ඒ සියලු අසිරි සිරි සෝදා හැර දැමීමයි. ගං වතුර , නායයාම් , අනාථ වීම්, අතුරුදහන් වීම් , මියයාම්, වෙසක් මාසය කම්පාකළ බොහෝ සිදුවීම් අතර ප්‍රමුඛස්ථානයක් ගත්තා.දැස දහස් ගණන් අපේම ජනතාව මේ ව්‍යසනයන්ගෙන් පීඩාවට පත්වෙද්දී සංවේදී මිනිස් සිත් එක පොකුරක්ව පෙළ ගැසුනේ මේ ව්‍යසනයට පත් මිනිසුනට තම හැකි පමණින් පිහිටක් වීමේ මං විමසමිනුයි.

HNB ග්‍රාමීන් සමාගමේ ප්‍රධාන කාර්යාලය ඇතුළුව අනෙකුත් ශාඛා වෙසක් මාසය තුළ පැවැත්වීමට සංවිධානය කර තිබූ දන්සැල් ඇතුළු විවිධ පුණ්‍යක්‍රියා අවලංගු කර එම මුදල් මේ ව්‍යසනයට මුහුණ දුන් ජනතාව වෙනුවෙන් වෙන්කිරීමට කටයුතු කළේ ඒ සමාජ වගකීම HNB ග්‍රාමීන් කළමනාකාර අධ්‍යක්ෂ තුමන් ඇතුළු සියලු දෙනාම මුළු හදවතින්ම පිළිගත් නිසයි. ලංකාවේ දසත විහිදුණු අප ශාඛා ජාලයේ නිළධාරීන් හා ප්‍රධාන කාර්යාලයේ නිළධාරීන් අසරණ තත්වයට පත් මිනිසුන් සොයා ගොස් ඔවුනට අවශ්‍ය ආහාර පාන, සනීපාරක්ෂක උපකරණ, බෙහෙත් ද්‍රව්‍ය, ආදිය බෙදාදෙමින් පිළිසරණ සැලසූ අයුරු අප කැමරා කාවයන්හි මෙසේ සටහන්ව තිබුණා

දැනුම වඩන්නයි - තැගි දිනන්නයි මෙහෙවර පැණසර ප්‍රහේලිකා අංක - 01



උපකාරක, හරහට :-

1. දිගු කාලයක් එකම ආයතනයේ සේවය කිරීමෙන් වැඩිපුර මේවා ලැබේ.
2. ලෝකයේ බලවත්ම හා බලපෑම් කළ හැකි කාන්තාවන් අතර ඉදිරියෙන්ම සිටින්නියකි.
4. සෘතු 4 න් එක් සෘතුවකි.
5. සඳුන් යන අරුත දේ.
6. අම්මා තාත්තා යන අරුත දේ.
8. පරම්පරාවෙන් උරුම වන්නකි.
9. පුහුණුවෙන් කිසිවෙකු ..... වන්නේ නැත.
10. 'මිනිස්' යන අරුථ දේ
11. විචිත්‍ර යන්නට සමාන පදයකි.

පහලට :-

1. HNB ග්‍රාමීන් හි සේවා කාලය වසර 15 ක් සපිරුනු තිදෙනාගෙන් දෙදෙනෙකුට මෙම වාසගම හිමිය.
2. HNB ග්‍රාමීන් අනුග්‍රහය ලැබූ පාසල් දෙකක් පිහිටියේ මේ නගරයේය.
3. පාඩු යන්නට විරුද්ධ පදයකි.
4. 2015 වර්ෂයේ HNB ග්‍රාමීන් හොඳම ශාඛාව පිහිටි දිස්ත්‍රික්කය
7. CRIB යන්නට යෙදෙන සිංහල වචනය
8. දීම යන අරුත දෙන පදයකි

නම : ..... සේවක අංකය : .....
ශාඛාව : ..... ප්‍රහේලිකාව පිරවූයේ වෙනත් අයෙකු නම් ඔහුගේ / නම .....
ඥාති සම්බන්ධය .....
දිනය : ..... අත්සන : .....

මෙහෙවර පැණසර ප්‍රහේලිකාව සැකසෙනුයේ මෙවර මෙහෙවර පුවත්පතේ පළව ඇති ලිපි වල අඩංගු කරුණු ඇසුරිනි. එම ලිපි කියැවූ ඔබට මෙම ප්‍රහේලිකාව පිරවීම කිසිසේත්ම අසීරු නොවනු ඇත. HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලයට හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට මෙම තරඟය සඳහා සහභාගී විය හැකි අතර නිවැරදිව ප්‍රහේලිකාව පුරවා එවන්නන් අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගන්නා ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට වටිනා තෑග්ග පිරිනැමීමට බලාපොරොත්තු වෙමු. ඔබගේ විසඳුම් ලබන මස 3 වන සතියට පෙර ංස්කාරක - මෙහෙවර පැණසර, HNB ග්‍රාමීන් අංක 168, නාවල පාර නුගේගොඩ ලිපිනයට ලැබෙන්නට සළස්වන්න.

..2 පිටුවෙන්

එසේම ඇය විවිධ සමාජ සේවා කටයුතු වලද නිරතවන්නිය. ඇයගේ වෙබ් අඩවිය Oprah.com මෙයට දැනට ප්‍රේක්ෂකයින් මිලියන 700 පමන පිරිසක් ඇතුල් වී තොරතුරු බලා ඇති අතර මසකට දළ වශයෙන් ප්‍රේක්ෂකයින් මිලියන 6 ක් පමන පිරිසක් ලෝකයේ ඇයගේ වෙබ් පිටුව කරා පැමිණ නරඹයි. ඇයගේ මෙම ගමනේ සුවිශේෂී සන්ධිස්ථාන ද පවතී. එනම්, ලෝකයේ බලවත්ම කාන්තාවක් ලෙස සහ වඩාත්ම බලපෑම් කළහැකි කාන්තාව ලෙස ද කිහිප වතාවක්ම තේරී පත් විය. ඇය අදටත් ලෝකයේ ජනප්‍රියත්වයේ ඉහළින්ම සිටින්නියකි. ඉතා අන්ත අසරණ මට්ටමකින් ජීවිතය අරඹා අවුරුදු 13 දී නිවසින් පැන ගොස් තම නෑදෑයන්ගේ ක්‍රෑර ලිංගික හිංසනයන්ට පත් වූ නූගත් කලු ගැහැණිය සුදු සමාජයේ මෙතරම් ඉහළට ගොස් ලෝකයම ආදරය කරන තැනැත්තියක් වූයේ ඇගේ නොසැලෙන, නොනැමෙන ආත්ම විශ්වාසය හැර වෙනත් කුමක් නිසාද යන්න ඔබම සිතා බලන්න. අපත් අපගේ ජීවිත පරිවර්තනයකට සුදානම් වෙමු. රැකියා ලෝකයේ ලැබිය හැකි ඔබගේ වෘත්තියේ යා හැකි ඉහළම ස්ථානයට යාමට ඔප්රාගේ ජීවිත කතාව සිතට ගෙන ජීවිත සාර්ථකත්වයට යාමට අධිෂ්ඨාන කර ගන්න. ඔබ ජය මාවත විවර කර ගන්න. ආත්ම විශ්වාසය දැන් සිටම අවධි කර ගන්න. ජය නියතයි.

බොහෝ දේ අපට අසාධාරණ ලෙස පෙනුනත් ලෝක පැවැත්මට එය එසේ සිදුවිය යුතුමය.

HNB GRAMEEN
මෙහෙවර 05
2016 මැයි - ජූනි

ණය ඉල්ලුම් කරුගේ ගති ස්වභාවයන් හඳුනාගනිමු

ණය භාර නිළධාරියෙකු ණය ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු කෙතරම් දුරට නිරවද්‍ය ද නැද්ද යන්න පිළිබඳව සොයා බැලීමේදී අනුගමනය කරනු ලබන සම්මුඛ සාකච්ඡා විධි සහ ඒවායේ සත්‍ය අසත්‍ය බව මැනවින් දැන ගැනීමට ණය භාර නිළධාරියා සතුවිය යුතු කුසලතා (interview Skill) පිළිබඳව පසුගිය මෙහෙවර කලාපයන්හිදී අපි සාකච්ඡා කළෙමු.මෙවර අපගේ අවධානයට යොමු වන්නේ ණය භාර නිළධාරියකු විසින් අවබෝධ කරගත යුතු ණය ඉල්ලුම් කරුවන්ගේ චරිත ස්වභාවයන් පිළිබඳවය.

ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමයේදී ඇප වන්කම් ආදිය පිළිබඳව නොසැලකෙන අතර එය වඩාත් පදනම් වන්නේ ණය ඉල්ලුම් කරුගේ චරිතය මත බව අප දන්නා කරුණකි. මෙහිදී ගනුදෙනු කරු හා ආයතනය අතර අතරමැදියකු ලෙස කටයුතු කරන ණය භාර නිළධාරියාට පැවරෙන වගකීම අසීමිත වූවකි.එනම් ගනුදෙනුකරු පිළිබඳව ආයතනය වෙනුවෙන් තීරණ ගනු ලබන්නා වන්නේ ඔහුය. ඒ අනුව ගනුදෙනු කරු විසින් සිය ණය අයැදුම් පත්‍රයෙහි දක්වා ඇති කරුණු වල නියම නිරවද්‍යතාව පිළිබඳව එනම් ඔහු සිතා මතා ගෙවීම් පැහැර හරින්නෙක්ද (willful Defaulter) නැද්ද (Unwillful Defaulter) යන්න තහවුරු කර ගැනීමක් ණය භාර නිළධාරියා විසින් සිදු කර ගත යුතුය.

ගනුදෙනු කරු ලබා ගන්නා ණය මුදල නියමිත පරිදි ආපසු ගෙවාවිද නැද්ද යන්න පිළිබඳව අවබෝධයක් ණය භාර නිළධාරියාට තිබීම අත්‍යාවශ්‍යය. ණය ලාභියා මෙම ණය මුදල ලබාගන්නේ එම ණය මුදල ආපසු ගෙවීමේ පවිත්‍ර චේතනාව ඇතිවද එසේත් නැතිනම් ණය නොගෙවා සිටීමේ චේතනාව පෙරදැරිවද යන්න පිළිබඳව ණය භාර නිළධාරියාට අවබෝධ කර ගත හැකි විය යුතුය. මේ අන්දමට ණය ඉල්ලුම් කරුවන්, ණය නැවත ගෙවීම සම්බන්ධයෙන් දක්වන නැඹුරුතාව විශ්ලේෂනය කරනු ලබන න්‍යායක් වෙයි. එය හැඳින්වෙන්නේ 10 -80 - 10 න්‍යාය යනුවෙනි.

10 -80 - 10 න්‍යාය

ඊට අනුව කියවෙන්නේ ණය මුදලක් ඉල්ලුම් කරන්නන්ගෙන් පළමු 10 නිත්‍ය වශයෙන්ම ණය ආපසු ගෙවන්නන් වන බවයි. දෙවන 80 ට අයත් වන්නේ නැවත ගෙවීමේ චේතනාවෙන් ණය ලබාගත්තද ව්‍යාපාරය බිඳ වැටීම හෝ ඒ හා සම්බන්ධ ගැටළුකාරී තත්වයක් මත ඔවුන් ලබා ගන්නා ණය මුදල නැවත ගෙවීම අතපසුවීමට ඉඩ ඇති බවයි.

මේ කොටසට අයත් වන්නන් අවංක පුද්ගලයන් වුවද ණය ලබා ගන්නා තුළ ඇති ව්‍යාපාරික ඥානයේ අඩු පාඩුකම් නිසා හෝ නිසි කළමනාකාරිත්වයක් නොමැති වීමේ හේතුව මත ව්‍යාපාරය අඩාල වී ණය ගෙවීමේ හැකියාව අඩු වන අවස්ථා දුලබ නැත.

ඒ අනුව ඔහු කොතෙක් අවංක පුද්ගලයකු වුවද ඔහුගේ චරිත ස්වභාවය සහ පසුබිම විමසා නොබලා ණය ලබාදීම ගැටළුකාරී තත්වයක් උද්ගත කළ හැකි බව පැහැදිලිය.

තුන්වන 10 යටතට ගැනෙන්නේ මුළුමනින්ම ණය ගෙවීම පැහැර හරින්නන්ය. නැතහොත් වංචාකරුවන්ය.

ණය මුදල් ලබාගන්නන් අතර අපට හමුවන මේ කොටස් තුනට අදාල චරිත ස්වභාවයන් පැහැදිලිව හඳුනාගෙන ඒ අනුව අපට ණය මුදල ලබාදිය හැකිනම් බොහෝ ගැටළු අවම කර ගැනීමට අපට හැකිවේ.

ඒ සඳහා ණය ඉල්ලුම් කරුගේ ණය අයැදුම්පතේ තොරතුරු ,ඔහු හා කළ සම්මුඛ සාකච්ඡාවෙන් විමර්ශනයට ලක්කළ තොරතුරු සේම ඔහු පිළිබඳව පසුබිම් විමර්ශනයක් කිරීම මගින් අයැදුම්කරු පිළිබඳ යම් නිගමනයකට ඒමට ණය බාර නිළධාරියාට අවස්ථාව ලැබේ.

ණය ඉල්ලුම් කරු පිළිබඳව පහත දැක්වෙන කරුණු ඔස්සේ විමර්ශනය කිරීමෙන් ඔහුගේ චරිත ස්වභාවය පිළිබඳව නිගමනයකට පැමිණිය හැකිය.

- ★ ණය ඉල්ලුම්කරු සහ ඔහුගේ සමාජ පසුබිම,
- ★ පවුල් පසුබිම,
- ★ ඔහුට ඇති සමාජ පිළිගැනීම,
- ★ සමාජ විරෝධී (මත්ද්‍රව්‍ය භාවිතය හා සූදු ක්‍රීඩා) කටයුතු වල හෝ ,නීති විරෝධී කටයුතු වල නියැලෙන්නෙක්ද යන වග,
- ★ ගමේ පොදු කටයුතු වලදී දක්වන සහයෝගය,- සමාජ සම්බන්ධතා පවත්වන ආකාරය තුළින් හා පොදු කටයුතු වලට දක්වන සැලකිල්ල මත සේම ඔහුගේ දේශපාලන සම්බන්ධතා පිළිබඳව විමසිලිමත් වීමෙන් ණය ඉල්ලුම්කරුගේ චරිතය පිළිබඳව ඇති කර ගන්නා අවබෝධය
- ★ ඔහු නියැලී සිටින ක්ෂේත්‍රයට අනුව ඔහු පිළිබඳව කළ හැකි තක්සේරුව,- එනම් ව්‍යාපාරික හෝ කෘෂිකාර්මික වැනි නියැලී සිටින කුමන හෝ ක්ෂේත්‍රයක් තුළ ඔහුගේ කැපවීම හා දක්ෂතාව ඔහුගේ වෘත්තිය සාර්ථකත්වය මත තීරණය කිරීමෙන් ඔහුගේ චරිත ස්වභාවය වටහා ගැනීම පහසුය.
- ★ මෙයට පෙර ලබා ගත් ණය මුදල් නැවත ගෙවා ඇති ආකාරය - (මෙය ණය තොරතුරු කාර්යාංශයේ (CRIB)තොරතුරු විමසීමෙන් දැගගත හැක)

මෙම කරුණු පිළිබඳව අවධානයට ලක්කිරීමෙන් එම පුද්ගලයාගේ චරිත ස්වභාවය පිළිබඳ අවබෝධයක් ණය භාර නිළධාරියාට නිතැතින්ම ලැබේ. එම කරුණු මත හා සලකා ලබන අනෙකුත් සුදුසුකම් සපුරා ඇති ආකාරය අනුව ඔහුගේ ණය අයැදුම්පත ණය ලබා දීම පිළිබඳව සලකා බැලීමට (Credit comity) ඉදිරිපත් කිරීම හෝ නොකිරීම ණය භාර නිළධාරියාගේ කාර්යයකි.

HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක/ ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතා සමඟ කළ සාකච්ඡාවක් ඇසුරිනි.

සෑම අයෙක් තුළම එක් හොඳ ක්‍රියාවක් හෝ ඇත.

ගනේෂන් රෝස් මේරි නෙටිකිලුප්පයි කුලම - වව්නියාව

HNB ග්‍රාමීන් අවශ්‍ය වේලාවට අවශ්‍යතාව අනුව ණය මුදලක් ලබා ගත හැකි ආයතනයක්

කලකින් වැසි පොදක් නොලැබීම නිසාම කාෂ්ටක වූ මහා පොළොව සමඟ ගතේ ශක්තියටත් වඩා හිතේ දහිරියකින් යුතුව ඔවුනට වැඩ කිරීමට සිදු ව තිබේ. ඒ අත නොසොල්වා, කට සෙලවිය නොහැකි බැවිනි. ගනේෂන් රෝස් මේරිගේ එළවළු වගා බිමට අප යන විටද ඔවුන් සිටියේ පුරුදු පරිද්දෙන්ම මහා පොළොවත් සමඟ ඔට්ටු වෙමිනි. මගේ මහත්තයා මේ වෘත්තිය එයාගේ ජීවනෝපාය විදිහට කරගෙන ගියේ තරුණ කාලේ ඉඳලමයි. අපිට අක්කර 3 ක විතර ඉඩමක් තියෙනවා. මේ ඉඩමේ අපි බෝංචි, කැරට්, ගෝවා, රටකජු, මිරිස්, වැටකොළ, පතෝල වගේ බෝග ජාති වගා කරනවා. අපිට ණය ඕන වෙන්නේ මේ වගාවට අවශ්‍ය පොහොර ඇතුළු අත්‍යාවශ්‍ය දේ මිල දී ගන්න. ඒකට අවශ්‍ය වේලාවට අවශ්‍ය ප්‍රමාණයේ ණය මුදලක් ලබා ගත හැකි ආයතනයක් විදිහට අපි විශ්වාස කරන්නේ HNB ග්‍රාමීන් සමාගමයි. ඒකේ නිලධාරී මහත්වරුන් අපේ අවශ්‍යතාවට අනුව කඩිනමින් ඔවුන්ගේ සේවාව ලබා දෙනවා විතරක් නෙමෙයි අපිට අවශ්‍ය උපදෙස් සහ ගුරුහරුකම් පවා ලබා දෙනවා.

මේ ව්‍යාපාරය මේ මට්ටමට ගෙන ආවේ ග්‍රාමීන් සමාගම නිසයි

විවිධ වර්ණයන්ගෙන් යුත් කඩදාසි වලින් ඇය තනනා විසිතුරු නිර්මාණ ඇතැම් විටෙක කඩදාසි වලින් තැනූ නිර්මාණදැයි එකවර හඳුනා ගැනීමට නොහැකි වන තරමට සියුම් සහ විචිත්‍රත්වයෙන් යුතුය. රුපිදා HNB ග්‍රාමීන් සමාගමෙන් ණය මුදල් ලබා ගත්තේ 2012 වසරේ සිටය. එහෙත් ඊට පෙර 2005 වර්ෂයේ සිට ඇය මේ අත්කම් නිර්මාණයන් හි යෙදුණු බවයි ඇය දිවිඩ බසින් අප සමඟ කියා සිටියේ.

මම අත්කම් නිර්මාණ ගැන පාඨමාලාවක් හැදෑරුවා. ඉන් පස්සේ ඉතා සුළුවෙන් මේක කර ගෙන ගියේ විනෝදාංශයක් විදිහට. ඒත් 2012 දී මම ග්‍රාමීන් සමාගමත් එක්ක සම්බන්ධ වුණාට පස්සේ ව්‍යාපාරයක් විදිහට මේක වැඩි දියුණු කර ගන්න පුළුවන් බව මට තේරුණා. ඉන් පස්සේ කොළඹ ගිහින් එකපාර මාසෙකට සෑහෙන්න කොළ ගෙනැත් විසිතුරු නිර්මාණ කරනවා. මාසෙකට මේ වගේ නිර්මාණ 29 ක් 30 ක් විතර කරන්න පුළුවන්. HNB ග්‍රාමීන් සමාගමෙන් ලැබෙන අතහිත මේ ව්‍යාපාරය මේ මට්ටමට රැගෙන එන්න විශාල පිටුවහලක් වුණු බව නොකියාම බැහැ.

ආර්. රාජ් රංජිදා - PSC පටුමග, මහරම්බෙයිකුලම් - වවුනියාව

බැංකු ණයක් ගන්න වෙන්න ඕන මහන්සිය ග්‍රාමීන් ණය ක්‍රමය නිසා නැතිවුණා...

ලී ඉදි ආප්ප වංගෙඩි නිෂ්පාදනය සිය ජීවන වෘත්තිය කර ගත් බාස්කරන් සෙල්ව රූබි අපට මුණ ගැහෙන්නේ වවුනියාවේ කට්ටාන් කෝට්ටාන් හිදීය. මේ තරුණ දෙන්න දෙමහල්ලන්ගේ එකමුතුවට තව සේවකයින් දෙදෙනෙකුගේ සහය ලැබේ.

මේක අපේ මහත්තයා අවුරුදු එකොළහේ ඉඳලා කරන ව්‍යාපාරයක්. අපට ඉදි ආප්ප වංගෙඩි 150 ක් හදන්න දවස් 11 ක් විතර යනවා. හදන ඒවා අපි කොළඹ ගෙනිහින් තොග මිලට විකුණනවා. මුල් කාලයේ මේ ව්‍යාපාරය කරන්න අපිට තිබුණු ලොකුම ගැටළුව වෙන්නේ අවශ්‍ය අමුද්‍රව්‍ය ගන්න ඕන කරන මූලික මුදල සොයා ගැනීමයි. ඒ ප්‍රශ්නෙට විසඳුමක් සොයමින් ඉන්න මොහොතක තමයි ග්‍රාමීන් සමාගම ගැන අපට දැන ගන්න ලැබුණේ. බැංකු ණයක් ගන්න වෙන්න ඕන මහන්සිය ගැන දන්න නිසා මුලදී ණය මුදලක් ඉල්ලන්න පස්ස ගැහුවත් මේ ගම්වල ඉන්න සෑහෙන සංඛ්‍යාවක් ග්‍රාමීන් සාමාජිකාවෝ ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කර ගන්න ඉතා පහසුවෙන් ග්‍රාමීන් බැංකුවෙන් ණය ගත්තු විදිහ ඇහුවම අපි තවත් ලතවෙවී නොඉඳ ග්‍රාමීන් සමාගමත් එක්ක එකතු වුණා. දැන් අපිට හිතේ බයක් නැතිව ව්‍යාපාරය කරගෙන යන්න පුළුවන්.

බී. සෙල්වරූබි - නෙල්ලුක්කුලම - වවුනියාව

සති වාරික ක්‍රමය නිසා ණය ගෙවද්දි ලොකු බරක් හිසමත පැටවෙන්නෙ නැහැ...

මම මුලින්ම ග්‍රාමීන් සමාගමට බැඳිලා ණය මුදල් ගත්තේ මහත්තයාගේ සුදු යකඩ වැඩපළට. ඒ අතරේ මම ගෙදරම පුංචි මැහුම් ව්‍යාපාරයක් කර ගෙන ගියා. මුලින්ම ගත්තේ රු. 25,000.00 ක ණය මුදල. ඒක මම දුන්නේ මහත්තයාගේ ව්‍යාපාරයට. 2014 වෙද්දි මම මගේ මැහුම් ව්‍යාපාරය මහත්තයාගේ වැඩ පළ ලඟ කඩ කාමරයට ආරන් ආවා. දැන් මම මෙතන කාන්තා හා ළමා ඇඳුම් මහනවා. වැඩිපුරම කරන්නේ ඇහුවුම් වලට මහන එක. මේ වෙනකොට ග්‍රාමීන් සමාගමෙන් එක් ලක්ෂ පනස් දාහේ ණය මුදල අරන් තියෙන්නේ. මගේ ව්‍යාපාරයත් මහත්තයාගේ ව්‍යාපාරයත් දෙකම සාර්ථකව පවත්වාගෙන යන්න පුළුවන් වෙලා තියෙන්නේ HNB ග්‍රාමීන් සමාගමෙන් ලැබුණු උදව් නිසයි. ගන්න ණය ගෙවන්න තියෙන්නේ සති වාරික ක්‍රමයට නිසා අතේ ඉතිරි කර ගන්න මුදල පහසුවෙන් ගෙවන්න පුළුවන්. ඒ නිසා ගත්තු ණය ගෙවද්දි ලොකු බරක් හිසමත පැටවෙන්නෙ නැහැ.

ජී. කේ. ඩී. දිල්රුක්ෂි - පැෂන්ෂා, තේක්ක වත්ත, නුවර පාර වවුනියාව

HNB GRAMEEN
මෙහෙවර 07
2016 මැයි - ජූනි

වැරදිකරුවෝ කිසිවිටෙකත් තම වරද නොදකිති

4 කොටස

ඇමරිකාව තුළ සිදු වූ වඩාත්ම අපකීර්තිමත් සිදු වීමක් ලෙසින් 1920 දී එරට මුහුණ දුන් "ටිපොට් ඩොම් තෙල් අපචාරය" සඳහන් කළ හැකිය. ඒ පිළිබඳව එරට පුවත් පත් රජයට පහර දුන්නේ හිත් පිත් නැති ලෙසිනි. එහෙයින් ජනතා නැගී සිටීමක් ද සිදුවිය. එහි සම්පූර්ණ සිද්ධිය මෙසේ යි.

ජනාධිපති හාර්ඩින්ගේ රජයෙහි අභ්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම්වරයා වූයේ ඇල්බර්ට් බී. ෆෝල් ය. ඇමරිකානු නාවික හමුදාවේ අනාගත ප්‍රයෝජනයට වෙන් කර තිබූ එප්ක් හිල් හා ටිපොට් ඩෝම් යන ප්‍රදේශයන් හි තෙල් ගබඩා ෆෝල් විසින් තම මිතුරෙකු වූ එඩ්වඩ් එල්. ඩොහෙනිට බද්දට ලබා දුන්නේ තනි කැමැත්තටය.

පවරා දීම සම්බන්ධයෙන් නිවැරදි ටෙන්ඩර් කැඳවීමක් ද ඔහු විසින් සිදුකර නොතිබිණි. එම උපකාරය වෙනුවෙන් ඩොහෙනි විසින් ෆෝල්ගේ ඉල්ලීම මත ඩොලර් ලක්ෂයක ණයක් පරිත්‍යාග කර තිබුණි. එතැනින් ද නොනැවතී ෆෝල් විසින් තවත් අණක් ද දුන්නේ ය. ඒ එල්ක් හි තෙල් ගබඩාව අද්දර හිඳින එක්සත් ජනපද නාවිකයන්ට අන් ප්‍රදේශයකට යන ලෙසිනි. එයින් එම නාවිකයන් ෆෝල්ගේ ඉල්ලීමට එරෙහි වී උසාවියේ පිහිට ඉල්ලා සිටියේ ය. එම තෙල් අපචාර සිද්ධිය හාර්ඩියන්ගේ රජයට බලවත් තර්ජනයක් වූ අතර රෙපබ්ලිකන් පක්ෂය ද එයින් විනාශයට පත්විය. අවසානයේදී සිදු වූයේ ඇල්බර්ට් බී. ෆෝල් හිරයට නියම වීමය.

එම ,ටිපොට් ඩොම් , තෙල් අපචාර සිද්ධියෙන් අපකීර්තියට පත් වූයේ ෆෝල් පමණක් නොවේ. ජනාධිපති හර්ඩියන්ග් ද එයින් ප්‍රබල අපකීර්තියකට පත් වූයේය. මෙම සිදුවීමෙන් මද කාලයකට පසුව ජනාධිපති හර්ඩියන්ග්ගේ සමීපතම මිතුරෙකු වූ හර්බට් හූවර් ප්‍රසිද්ධ දේශනයකදී කියා සිටියේ ෆෝල් ගේ මිතු ද්‍රෝහිත්වය හේතුවෙන් ජනාධිපති හර්ඩියන්ග්



බලවත් අපකීර්තියකට සේම සිත් තැවුලට පත්ව ඒ හේතුවෙන් ඔහු අකාලයේ මිය ගිය බවය. මෙම දේශනයට සවන් දුන් ෆෝල් ගේ බිරිඳ බලවත් කෝපයකට පත් වූවාය. ඇය හඬමින් දේශනශාලාව දෙවනත් වන අන්දමින් කෑ ගසමින් කීවේ මෙවැන්නකි. **"ෆෝල්, ජනාධිපති හර්ඩියන්ග් ට ද්‍රෝහිකමක් කළා කියලා ඔබ කියන්නෙ කොහොම ද? ඒක සහමුලින්ම වැරදි කතාවක්. මගේ මහත්තයා කිසිම කෙනෙකුට මිත්‍ර ද්‍රෝහිකමක් කරලා නැහැ. පාවාදිලත් නැහැ. මේ දේශන ශාලාව රත්තරන් වලින් පුරවලා තිබුණත් ෆෝල් ඒ කිසිම දෙයකට අත තියන කෙනෙක් නෙවෙයි. හැබැයි ෆෝල්ට හුඟ දෙනෙක් මිත්‍රද්‍රෝහිකම් කළා. ඔහුව පාවා දුන්නා. ඔහුව වැරදිකරුවෙකු කළා."**

වැරදිකරුවන්ට චෝදනා එල්ල කිරීමද වරදක් වන අවස්ථා තිබේ. එයට හේතු වන්නේ යමෙකු වරදක් කර ඇති බව මුළු සමාජයම පිළිගත්තද ඔහුව ආරක්ෂා කිරීමට යම් පිරිසක් අප අතරම හිඳිමය. ඇල්බර්ට් බී. ෆෝල් නිසා පැන නැගුණු ,ටිපොට් ඩොම් තෙල් අපචාර, සිද්ධියෙන් අපකීර්තියට සේම සිත් තැවුලට පත්ව හාර්ඩිය න්ග් අකාලයේ මිය ගිය බව කවුරුත් පිළිගත් කාරණයකි. නමුත් ඒ පිළිබඳව කතා කරන්නට ගොස් පිරිසක් මැද්දේ අසීරුවට පත් වූයේ හර්බට් හූවර්ය. අන්‍යයන්ව විවේචනය කිරීමෙන් සිදුවන හානිය කෙතරම් ද?

මුළු ලොවටම බලපෑම් කරනු ලබන මිනිස් ස්වභාවයක් වෙයි. ඒ වරදකරුවන් සැමවිටම අන්‍යන්ට දොස් පැවරීමය. එහෙත් තමාගේ වරද නොදකී. ඒ කවුරුත් කරනු ලබන්නකි. මට යම් අයකුගේ කිසියම් වරදක් විවේචනය කිරීමට සිතුනොත් එකවරම සිහියට නැගෙන්නේ අල් නැපෝන්, ටූගන් ක්‍රෝලි හෝ ඇල්බර්ට් ෆෝල් ය. මන්ද විවේචනය කිරීම යනු අප අහසට දමා ගසනු ලබන පරවියෙකු නැවත නිවස සොයා ගෙන ඒමට සමාන සිදු වීමකි. විවේචනයන් ද ආපසු තමා වෙතට ම එයි. යම් අයකුගේ වරදක් නිවැරදි කිරීම හෝ ඔහුව ප්‍රතික්ෂේප කිරීම මඟින් සිදු වන්නේ අන් දෙයකි. ඔහු වරද සාධාරණීක-රණය කරගෙන අපව ප්‍රතික්ෂේප කරනු ලබයි.

වාසනා ලියනආරච්චි

HNB ග්‍රාමීන් වාර්ෂික ප්‍රගති සමාලෝචනය දා...

HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ වාර්ෂික ප්‍රගති සමාලෝචන හමුව මේ වසරේ පැවැත්වුණේ පසුගිය අප්‍රේල් 30 දා.ඒ සිදුවේ ඔන්රිච් හෝටල් පරිශ්‍රයේදී.මෙවරද අති උත්කර්ෂවත් ලෙස පැවැත්වුණු වාර්ෂික සේවක හමුව පසුගිය වර්ෂයන්ට වඩා වඩාත් විචිත්‍රත්වයකින් සහ නව විශේෂාංග රැසකින් අලංකෘතව පැවැත්වීම විශේෂත්වයක්. **HNB** ග්‍රාමීන් සමාගමේ සිය සේවා කාලය වසර දහය ඉක්මවූ කාර්ය මණ්ඩලය ඇගයීමට ලක්කිරීම සේම වසර පහළොව ඉක්මවූ කර්යමණ්ඩල නිළධාරීන් අගැයුමට ලක්කිරීම මෙවර සේවක හමුවේ එක් සුවිශේෂී අවස්ථාවක් වුණා.ඊට අමතරව හොඳම පැමිණීම,හොඳම විකුණුම් නිළධාරී(ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු)වඩාත් අපේක්ෂා සහගත නිළධාරිවරයා,නැගීඑන ශාඛාව,හොඳම ක්ෂේත්‍ර විධායක, හොඳම ශාඛාවන් තුන යන අංශ සඳහා මුදල් ත්‍යාග සහ සම්මාන පිරිනැමුණා.

මෙවර වාර්ෂික ප්‍රගති සමාලෝචන සේවක හමුවට **HNB** ග්‍රාමීන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක /ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රහාත් මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්වූ අතර අධ්‍යක්ෂිකා ක්‍රිෂාන්ති තම්බයියා මහත්මිය ප්‍රධාන මෙහෙයුම් නිළධාරී ප්‍රියලාල් අරංගල මහතා ඇතුළු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු **HNB** ග්‍රාමීන් කාර්ය මණ්ඩලය සහභාගී වුණා.

යාළු ඉතුරුම් තරගාවලියේ ජය වත්තලට

ලීසිං ප්‍රවර්ධනයෙන් මුල්තැනට

දස වස සැපිරූ සේවක අභිමන

HNB ග්‍රාමීන්
ශාඛා අතරින් දෙවනි තැනට
යාපනය ශාඛාව

ග්‍රාමීන් යුග මෙහෙවරට කැපවූ පහළොස් වසක්

වසරේ නැගී එන ශාඛාව... මඩකලපුව

දොරකුඹුර හොඳම ක්ෂේත්‍ර විධායක සම්මානය දිනා

හොඳම අළෙවි විධායක (ඉතුරුම්) සම්පත්

සියයට සියයක් වූ නැවත අයකර ගැනීම වෙනුවෙන් යාපනය සහ වවුනියාව

නිතරම ඉදිරියට යා යුතු අතර පස්සට යන විදියත් දැන ගත යුතුය.

අප හමුවේ ඇත්තේ අමාරුදෙය මිස කරන්න බැරි දෙය නොවේ.

වවුනියාව ශාඛාවේ නිළධාරි මණ්ඩලය

HNBග්‍රාමීන් ශාඛාවක විගතුග

HNB ග්‍රාමීන් සමාගමේ 2016 වසරේ වාර්ෂික ප්‍රගති සමාලෝචන උත්සවය පැවැත්වූයේ පසුගිය අප්‍රේල් 30 වෙනිදාය.වසරේ විවිධ අංශයන්ගෙන් විශිෂ්ඨතා දැක්වූවන් ඇගයීමට ලක්වෙද්දී කාගෙත් වැඩිම අවධානයට පාත්‍ර වූයේ මේ වසරේ හොඳම ශාඛාව කුමක්වේද යන්න පිළිබඳවය. ශාඛා කළමනාකරුවන් ඇතුළු ඒ ඒ ශාඛාවන්ගෙන් පැමිණ සහභාගී වූ නිළධාරීන්ගේ හදවත් ගැහෙන හඩ ඇසිය හැකි නම්...හෝ ඒ හදවත්හි සිතුවිලි කියවිය හැකි නම් ....මට එලෙස සිතුණු වාර අපමණය. එකිනෙකාට නොපරදින තරඟයක නියැලි ශාඛාවන් අතරින් අවසාන ජයග්‍රාහකයා පිළිබඳ තීරණාත්මක විනිශ්චය ප්‍රකාශයට පත්කෙරුණෝ HNB ග්‍රාමීන් වවුනියාව ශාඛාව ජයග්‍රාහකයා බවට පත්කරමිනි. මෙවර මෙහෙවර ''ශාඛාවක විගතුග'' විමසීමට වවුනියාව ශාඛාව තෝරාගැනීමට අපට උත්තේජනය සපයනුයේ ඔවුන් ලැබූ මේ සුවිශේෂී ජයග්‍රහණයයි. 2002 ඔක්තෝබර් 16 වෙනි දින සිට මෙහෙයුම් කටයුතු ආරම්භ වන වවුනියාව ශාඛාවට HNB ශාඛා ලයිස්තුවේ හිමි වනුයේ හයවන ස්ථානයය. වසර දහහතරක අත්දැකීම් සපුරමින් සිය ශාඛාව මේ දක්වා පැමිණි ගමන පිළිබඳව අප සමග කතා බහකට මුල පිරූ වවුනියාව

මල්ලාවි ශාඛාවේ නිළධාරි මණ්ඩලය

මුලතිවු ශාඛාවේ නිළධාරි මණ්ඩලය

ශාඛාවේ කළමනාකරු මහලිංගම් සුමන්රාජ් සිය පිළිසඳර ඇරඹුවේ මෙසේය. ''වවුනියාව ජනඝනත්වය අතින් අඩු වුණාට විශාල ප්‍රදේශයක් පුරා ඒ ජනගහනය විසිරී සිටින දිස්ත්‍රික්කයක්. මේ නිසාම විශාල ප්‍රදේශයක අපේ මධ්‍යස්ථාන විසිරී තියෙනවා. මේ නිසාම අපේ ශාඛාව හරහා සේවා සැපයීමේ කටයුතු වඩාත් පහසු කර ගැනීමේ අරමුණෙන් වවුනියාව ශාඛාව යටතේ තවත් සේවා මධ්‍යස්ථාන තුනක් සිය මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබනවා. ඒ මුලතිවු, මල්ලාවි, නෙල්ලිඅඩි කියන සේවා මධ්‍යස්ථාන. මේ පළාතේ සිංහල, මුස්ලිම් ,දුවිඩ කියන ජන වර්ග තුනම සහජීවනයෙන් යුතුව ජීවත්වෙනවා. ඔවුන් ජීවනෝපාය විදිහට වැඩි පුරම කරන්නේ කුඹුරු ගොවිතැන, ඒ වගේම එළවළු වගාව. ඊට අමතරව සාමාන්‍යයෙන් වෙනත් ප්‍රදේශයන්ගේ දකින්න පුළුවන් ව්‍යාපාර හැම එකක්ම වාගේ මේ පළාතේ දකින්න පුළුවන්. අපේ මධ්‍යස්ථාන 358 සාමාජිකාවන් 13163 දෙනෙක් මේ වන විට සිය ව්‍යාපාර සඳහා HNB ග්‍රාමීන් ණය මුදල් ලබාගන්නවා. ඔවුන් වෙනුවෙන් අපේ උපරිම කැපවීම සහ කාර්යක්ෂමතාව යොදවලා සේවාවන් සැපයීමටයි නිරන්තරයෙන් උත්සුක වෙන්නෙ. අප ලබාදෙන සේවාව අප ගනුදෙනු කරුවන්ට වගේම අප සමාගමටත් උපරිම වශයෙන් ලබාදීමට අප ගත් වෑයමේ ප්‍රතිඵලයක් විදිහටයි 2015 වසරේ හොඳම ශාඛාව විදිහට අප සම්මානයට පාත්‍රවෙන්නේ. අපේ සේවා මධ්‍යස්ථාන තුනත් ඇතුළුව වවුනියාව ශාඛාවට අයත් මුළු කාර්යමණ්ඩලයම පසුගිය වසරේ මුල අපට ඉලක්ක ලබාදුන් මොහොතේ සිට ක්‍රියාත්මක වුණා.**

ලබාගත් ජයග්‍රහනය ඉදිරියට රැක ගැනීමේ අභියෝගය දැන් අපි ඉදිරියේ...

- HNB ග්‍රාමීන් වවුනියාව ශාඛාව

කිලිනොච්චි ශාඛාවේ නිළධාරි මණ්ඩලය

විශේෂයෙන් වෙන සැර වල වගේ අප එක් අංශයක් සඳහා වැඩියෙනුත් තවත් අංශයක් සඳහා අඩුවෙනුත් වශයෙන් කැපකිරීමක් කළේ නෑ. සමස්තයම එක ඒකකයක් විදිහට අරගෙන අපේ මුළු ශක්තියම ඒ සෑම අංශයකින්ම අප වෙත ලබාදුන් ඉලක්කයන් සපුරාලීමට යෙදෙව්වා. ඒ වෑයමේ ප්‍රතිඵලය තමයි මේ ජයග්‍රහනය. ඒ සඳහා අපව මෙහෙයවපු පසුපස ඉදිමින් උපදෙස් හා මග පෙන්වීම ලබාදුන් සහකාර සාමාන්‍යාධිකාරී මහින්ද රත්නායක මහතාටත් අප ප්‍රාදේශීය කළමනාකරු ජෝශප් ජෝන් මහතාටත් විශේෂයෙන් ස්තූතිවන්ත වෙන්න ඕන. ඊට අමතරව එක රෑනක් වගේ මේ ඉලක්කය හඹා ගිය මගේ කාර්ය මණ්ඩලය මේ ජයග්‍රහනයේ අනිවාර්ය කොටස් කරුවන් මේ ලබාගත් ජයග්‍රහනය ඉදිරියට රැක ගැනීමේ අභියෝගය දැන් මට තියෙනවා. ඒ වගේම ඉහළම සේවාවක් අප ගනුදෙනු කරුවන් වෙත ලබාදෙමින් HNB ග්‍රාමීන් නාමයේ ගරුත්වය ආරක්ෂා කරගැනීමට අප බැඳී සිටිනවා.

මේක අපි සැලසුමකට අනුව ක්‍රියාත්මක වී ලබාගත් ජයග්‍රහනයක්.

මහින්ද තිස්ස රත්නායක - සහකාර සාමාන්‍යාධිකාරී

මෙවර වවුනියාව ශාඛාව ඇතුළු අපට අයත් ශාඛාවන් ජයග්‍රහනය කරා ගෙන ඒමේ වෑයමේ අපි නිරත වුණේ ගිය අවුරුද්දේ ශාඛාවන් සඳහා ඉලක්ක ලබාදුන් මොහොතේ ඉඳලයි. අපි මෙහෙයුම සැලසුමකට අනුවයි ක්‍රියාත්මක කළේ. මුල ඉඳලම සෑම අංශයකටම අවධානය යොමු කරමින් අඩු පාඩු නිවැරදි කර ගනිමින් අපි ඉදිරියට ගියා.වැරැද්දක් විය හැකි තැන් ගැන නිරන්තර සෝදිසියෙන් හිටියා වගේම ආයතනය මගින් ලබාදුන් ඉලක්කයන් පිළිබඳ සතිපතා විමසීමක් කළා. ඒ ලබාගන්නා වාර්තා වලට අනුව වැඩි අවධානයක් යොමු කළ යුතු අංශ මොනවාද ඒ සඳහා යෙදිය හැකි ප්‍රතිකර්ම මොනවාද යන්න ගැන අප කාර්ය මණ්ඩලය සමග එක්ව සාකච්ඡා කරලා තීරණ ගත්තා. මේ කාර්ය සඳහා අපෙන් සිදුවුණේ මග පෙන්වීම සහ අවශ්‍ය සාධක සම්පාදනය කරදීම පමණයි එහි මහන්සියේ සහ කැපවීමේ ගෞරවය අපේ කාර්යමණ්ඩලයට හිමිවිය යුතුයි.

වවුනියාව සහ යාපනය ශාඛා එක දෙක අතර ඉන්න ඕන කියන අධිෂ්ඨානයේ අපි මුල ඉඳලා හිටියා...

ප්‍රාදේශීය කළමනාකරු ජෝෂප් ජෝන්

ප්‍රධාන ශාඛාවෙන් අපිට ඉලක්ක දුන්නු දවසෙම අපි අපේ ප්‍රාදේශිකයේ කණ්ඩායම රැස්වෙලා වවුනියාව සහ යාපනය ශාඛා එක දෙක අතර ඉන්න ඕන කියන මතයට ආවා. ඒ අධිෂ්ඨානයෙන් ඇරඹූ ගමනක ප්‍රතිඵලය තමයි මේ. අපි අපේ කාර්ය මණ්ඩලය වෙන වෙනම අරන් ඔවුන්ට උද්ගතව ඇති ගැටළුවක් වේ නම් ඒ ගැන කතා කරලා විසඳුම් ලබාදීලා අවශ්‍ය අභිප්‍රේරණය ලබාදුන්නා. ඒ සඳහා නිරන්තරයෙන් අප පසුපස හිඳිමින් අවශ්‍ය මග පෙන්වීම කළ සහකාර සාමාන්‍යාධිකාරී මහින්ද මහතා ඇතුළු ප්‍රධාන කාර්යාලයේ නිළධාරි මණ්ඩලයේ සහය විශේෂයෙන් අගය කළ යුතුයි.

එස්. රොෂාන්
ප්‍රාදේශීය ගණකාධිකාරී

එම්. සුමන්රාජ්
කළමනාකරු

ඒ. ජෙනර්දන්
කළමනාකරු - ක්ෂුද්‍ර මූල්‍ය

එම්. සුජේෂ්
ජ්‍යෙෂ්ඨ විධායක

වී. ක්‍රිෂ්ණමූර්ති
සහකාර කළමනාකරු

ජේ. සුයාන්ත්
සහකාර කළමනාකරු

සටහන -
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ඡායාරූප -
ලක්ෂ්මන් කුමාරතුංග

දිවසේ සුන්දරම පැය 4ට

පුහුණුවෙන් කිසිවකු නිපුණයකු වන්නේ නැත

සේවක ඵලදායිතාවය ගැන කතා කරද්දි පසුගිය කලාපයෙන් අපි ආයතනයෙන් ඔවුන් වෙත පැවරිය යුතු අභ්‍යන්තර හා භාහිර දායාදයන් ගැන කථා කළා, ඒ අනුව මෙහිදි භාහිර දායාදයන් ලෙස වැටුප් දීමනා , දිරි දීමනා, පාරිතෝෂික දීමනා ආදිය ගණන් ගැනෙනවා. අභ්‍යන්තර දායාදයන් ලෙස ආදරය දැයාව , සෙනෙහස ලැබීම . උසස් වීම් අගය කිරීම ආදි මනස චක්‍ර ලෙස තෘප්තිමත් වන්නා වූ හදවතින් බලාපොරොත්තු වන අවශ්‍යතාවයන් ඉටු වෙන්න ඕන. මෙම කරුණ ගැන අවධානය යොමුකළහොත් ආයතනයක් ගොඩ නගා ගන්න, ගොඩ නැගූ ආයතනයක් පවත්වාගෙන යන්න ඉතා පහසුවෙන් පුළුවන් වෙනවා. අවසාන වශයෙන් වැදගත් කියමනක් මතක් කළ යුතුයි. පුහුණුවෙන් ඔබ නිපුණ වේ. (Practice Makes You Perfect). මෙම කියමන ගොඩක් පරණයි නමුත් මෙම කියමනේ අර්ථය දැන් ගැටළු සහගතයි. පුහුණුවෙන් අයෙක් නිපුණවන්නේ නැහැ. පුහුණුවෙන් කෙනෙක් ස්ථීර වෙනවා , Practice Makes You Peremernet අපි වැරදි දේ කාලයක් පුහුණු කළොත් අපි කොහොමද නිපුණ වෙන්නේ, නිපුණ කියන්නේ අතිදක්ෂ කියන එක. පුහුණුවෙන් ඔබ ස්ථාවර වේ. යන කියමන වඩාත් නිවැරදියි. වැරදි දේ කාලයක් තිස්සේ පුහුණු වුනහම වැරදි දේ තුළ ඔබ ස්ථාවර වෙනවා. ඊට පස්සේ ඒ වැරදි දේ හරිදේ කියලා පේන්න පටන්ගන්නවා. ඒ ක්‍රමයට තමයි ඕනම චන්ඩියෙක් අපරාද කාරයෙක්, කඩාකප්පල් කාරයෙක් , කැරලි කරුවෙක් බිහිවන්නේ, අපි ඔවුන්ට ඉතාම කාරුණිකව මනෝවිද්‍යානුකූලව හරිදේ සහ නිවැරදි දේ ක්‍රියාත්මක කිරීමට අදාල ක්‍රම ශිල්ප කියාදෙන්න ඕන එම ක්‍රම ශිල්ප තුළ යෙදෙමින් නිවැරදි දේ ස්ථාවර වනතුරු දිගටම කරගෙන යාමට අඛණ්ඩ පුහුණුවක් ලබාදෙන්න ඕන. මෙය සෑම බුද්ධිමත් ව්‍යාපාරික නායකයකු විසින්ම දැරිය යුතු වගකීමක්. යම් නායකයෙක් එසේ කරන්නේ නම් එය උතුම් බුද්ධිමත් නායකයකුගේ උසස් ලක්ෂණයක්.

පෞරුෂත්ව පුහුණු විශේෂඥ
නීතිඥ, වෛද්‍ය
කුමා ඉද්දමල්ලෙන

තමන්ගේ අවස්ථාව තමන්ම උදාකර ගත යුතුය.

ව්‍යවසායකත්වයේ ස්වභාවය

ව්‍යාවසායකත්වය යනු යමක් දෙස බලන යමක් ගැන සිතන හෝ යමක් පිළිබඳ ක්‍රියා කරන ආකාරයයි. සම්මතයට පටහැනිව සිතමින් අලුත් යමක් පිළිබඳ සිහින මවමින් ඒවා යථාර්තයක් බවට පත් කිරීමට ව්‍යවසායකත්වය මූලාරම්භය සපයයි.

ව්‍යවසායකයකු යමක් දෙස බලන ආකාරය සාමාන්‍ය මිනිසෙකු ඒ දෙස බලන ආකාරයට වඩා බෙහෙවින් වෙනස් ය. එම නිසා බහුතරයක් විසින් විනාශයක් අපහැදිලි භාවයක් අවුලක් ලෙස දකින දෙය ව්‍යවසායකයාට හොඳ අවස්ථාවකි. අන් අයට තෘප්තියක් දනවන දෙය ව්‍යවසායකයාට ආතෘප්තියක් ගෙන දේ. අන් අයට වැදගත් කමක් නොමැති දෙය ව්‍යවසායකයාට ඉතා වැදගත් ලෙස පෙනෙනු ඇත. අන් අය සඳහා අධික අවධානම් සහිත කාර්යක් වන දෙය ව්‍යවසායකයාට අභිප්‍රේරණ මූලාශ්‍රයකි. මෙය සත්‍ය වශයෙන්ම ව්‍යවසායකයා තුළ පවතින අද්විතීය වූ විශ්වාස, ආකල්ප හා අගය කිරීම් යන ආදියෙහි එකතුවක් තුළින් නිර්මාණය වූ මානසික ප්‍රවනතාවයකි. එබැවින් ව්‍යවසායකත්වය යනු මිත්‍යාවක් හෝ කලාවක් නොව මනෝ ස්වභාවයක් ලෙස හැඳින්වේ.

ව්‍යවසායකත්වය වෘත්තියක් **(Profession)** ලෙස හැඳින්විය හැකිය. ,නව නිපැයුම් කිරීමේ නිපුණතාවය ප්‍රගුණ කිරීම හෙවත් සත්‍ය ආධුනිකත්වය **(True Apprenticeship)** යන අර්ථය ව්‍යවසායකත්වය සංකල්පයේ ගැබ්ව ඇත.

ඇපල්...
ස්ටැණ්ෆර්ඩ් විශ්ව විද්‍යාල උද්ඝෝෂණයේ දිගු හැරුම

මම ඉස්සර වෙලාම විශ්ව විද්‍යාලයකින් පිටතට විසි වුණේ මගේ ජීවිතයට මාස 6 ක් පමණ වන විටයි. මොකක් ද ඒ කථාව කියලා ඔබ පුදුම වේවි. ඇත්තටම මගේ පෙව විද්‍යාත්මක මව එනම් සැබෑ මව විශ්ව විද්‍යාල සිසුවියක්. අවිවාහක ඇය ගැබ් ගැනීමේ ප්‍රතිඵලය මගේ ජීවිතයයි. ඇයට මා ඇති දැඩි කර ගැනීමේ හැකියාවක් හෝ අවශ්‍යතාවයක් තිබුණේ නෑ. නමුත් ඇයට ඕන වුණා මා විශ්ව විද්‍යාලයක උපාධිධාරී කැප කරු දෙමාපියන් දෙදෙනකු වෙත භාර කරන්නට. ඒ අනුව ඇය එවැනි පුද්ගලයන් තෝරා ගෙන තිබුණා. නමුත් ඔවුන් අපේක්ෂා කළේ මගේ මවගෙන් ගැහැණු දරුවෙක්. මේ නිසා මේ දෙමාපියන් මා ප්‍රතික්ෂේප කළා. මගේ වර්තමාන කැපකරු දෙමාපිය යුවලට මේ පණිවිඩය එන්නේ මහ රෑ. ඔයාලා පිරිමි දරුවෙකුට කැමති ද?. මෙතෙක් කල් දරුවෙකු හදා වඩා ගැනීම පිළිබඳ පොරොත්තු ලේඛනයේ සිටි ඔවුන්ට ඉහේ මල් පිපුණා වාගේ. අන්තිමේ දී මගේ මව ඔවුන්ට විශ්ව විද්‍යාලයක උපාධියක් නොමැති වීම හේතුවෙන් දරුවා ලබා දීම ප්‍රතික්ෂේප කළා. නමුත් ඔවුන් මා කවදා හෝ විශ්ව විද්‍යාලයක උසස් අධ්‍යාපනයට යවන පොරොන්දුව මත මේ යුවලට භාර දී තිබෙනවා. ස්ටීව් ජොබ්ස්ට දෙමාපියන් හමුවන්නේ මෙවැනි සරසවි සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුවයි. පොරොන්දු ආකාරයෙන් මගේ හදාගත් දෙමාපියන් මා වයස අවු. 17 දී සරසවියට යැවුවා. එයත් ස්ටැෆර්ඩ් වගේම මල අධික සරසවියක්. වැඩ කරන පංතියේ වූ මගේ දෙමාපියන්ගේ සකල සේසතම මේ සරසවි අධ්‍යාපනය වෙනුවෙන් වැය වුණා. ඔවුන් මුළු ජීවිත කාලය තුළම හම්බ කළ මුදල් මා වෙනුවෙන් වැය කරන්නට ගියේ මාස 6 ක් වැනි කාලයක්. එහෙත් මට මේ සරසවි ජීවිතය තුළ කිසිදු ආලෝකයක් පෙනුනේ නැහැ. මා සිටිය යුත්තේ කොතැන ද? මාගේ ඉලක්කය කුමක් ද? යන්න පිළිබඳව කිසිදු වැටහීමක් ලබා ගැනීමට මේ සරසවි ජීවිතය මට උදව් කළේ නෑ. මේ නිසා මම නැවත තීරණය කළා සරසවියෙන් ඉඳියට බහින්න. මේ කාලය මට ආර්ථික අතින් ඉතාම අසීරු කාලයක්. මට ඉන්න හිටින්න තැනක් තිබුණේ නෑ. මම නිදා ගත්තේ යාළුවන්ගේ කාමර වල බිම. මා ළඟ තිබුණු කොකා කෝලා බෝතලයක් පවා මට අන්තිමේ දී කෑම ගන්න විකුණාන්න සිදු වුණා. කුසගින්න යාන්තමට පිරි මහගන්න මට සෑම ඉරිදාවක හොඳ කෑම වේලක් නොමිලේම කන්න නගරය හරහා සැතපුම් 7 ක් පයින් යන්න වුණා. මම සෑම ඉරිදාම නගරයේ තිබූ හරේ ක්‍රිෂ්ණා පන්සලට ගියා. එහි සති අන්ත පූජාවේ දී ලැබෙන ආහාරය ඉතා රසවත්. මෙයට මා ඉතා ප්‍රියකළා වගේම එයින් මගේ කුසගින්න පිරුණා. මේ කාලයේ දී තමයි රිඩ් සරසවිය මඟින් පවත්වන අක්ෂර විද්‍යාව **Binary science** පිළිබඳ පාඨමාලාවක් ගැන මගේ නෙත ගැටුණේ. එම සරසවි බිම පුරාම අක්ෂර කලාවේ නව මානයන් පිළිඹිබු කරන අලංකාර අක්ෂර රටා මගේ සිත් ගත්තා. මා ඉන්පසුව යොමු වුණේ මේ අක්ෂර කලාව ඉගෙන ගන්නටයි. එය මගේ සිත හොඳින් ඇදී ගිය එකක් වුණා. මම අක්ෂර රටා හා ඒ සම්බන්ධව පවතින ශාස්ත්‍රීය පසුබිම ඉතිහාසය පිළිබඳව ඉගෙන ගත්තා. අක්ෂර විද්‍යාව මේ ආකාරයෙන් ඉගෙන ගත්තත් මට එය මගේ අනාගතය සම්බන්ධ කිසිදු ආකාරයකින් සමීප කර ගැනීමේ අදහසක් තිබුණේ නෑ. එයින් වැඩක් ගත්තේ නෑ. එහෙත් වසර 10 කට පසු මම මගේ පළමු ඇපල් මැකින්ටොෂ් පරිගණකය නිර්මාණය කළාට පසු ලෝකයේ විශිෂ්ටතම රූ රටා සහිත පරිගණකය බවට ඇපල් පරිගණකය පත් කරන්න අපට හැකි වුණේ මගේ අක්ෂර විද්‍යාව **Binary science** දැනුම නිසයි. ඇපල් පරිගණකය ලෝ පුරා ජනප්‍රිය වීමේ මූලික හේතුව වුණේ මෙයයි.

පුද්ගල පරිගණක අංශයෙන් ඒ වන විට ඒ තරම් සාර්ථකත්වයට නොගිය වින්ඩෝස් මෙය කොපි නොකරන්නට පුද්ගල පරිගණක ක්ෂේත්‍රය මේ තරම් ඉක්මනකට දියුණුවෙයැයි මා සිතන්නේ නෑ. ලෝකයටම තීරණාත්මක වූ මේ මුල පිරීමට හේතුව ඇපල් සමාගම මැකින්ටොෂ් පුද්ගල පරිගණක බිහි කිරීම ම නොව මගේ අක්ෂර විද්‍යා පාඨමාලාව බව මෙහි දී ඔබට පෙනෙනවා ඇති. මම අවුරුදු 10 කට පෙර කල දේ ගැන සිතීමෙන් අනාගතය සම්බන්ධ-යන් තැබූ පියවරවල වැදගත්කම ඔබට පාඩමක් වනු ඇත.

අප අතීතයේ ඉගෙන ගත් දේ, වර්තමානයේ ඉගෙන ගන්නා දේ අපේ අනාගතයේ දී, ලෝකයේ අනාගතයේ දී කොතරම් දුරට වැදගත් වේද යන්න මෙහි දී අප වටහා ගත යුතු ය. අප අනාගතය ගැන පමණක් සිතීමෙන් වැඩක් නෑ. අප අනාගතය ගැන සිතිය යුත්තේ අපේ අතීත පාඩම් ද සමගයි. මගේ කතාව ඊට හොඳම උදාහරණයක් අපට අප කරන කියන දේ ගැන විශ්වාසයක් තිබිය යුතුය. ඒ මත අපට ජයග්‍රහණය කළ හැකිය. එසේත් නැතිනම් අපේ ධෛර්යය, අපේ ශක්තිය, අවංක කැපවීම, නැතිනම් කර්මය පිළිබඳ ව අපේ විශ්වාසයක් තිබිය යුතුය. ඒ මත අපට ජයග්‍රහණය කළ හැකියි. මගේ මේ ප්‍රවේශය අද මා සාර්ථක පුද්ගලයෙකු බවට පත්කොට තිබෙනවා. එය මගේ පළමු කතාවයි.

සඳකැලුම් ජයතුංග,
ගණකාධිකාරි,
එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්.

සෑම පරාජයක්ම වෙස් වලාගෙන එන ආසිරි ගැන්වීමකි.

පිටුවෙන්....

සොයා බලා උපුටා දුන්නේ - අනුරුද්ධ පොන්නම්පෙරුම













ප්‍රතිචාර දැක්වීම ඉතා වැදගත් වුවත් එය අවශ්‍ය වේලාවේදි පමණක් කළ යුතුය.

ඔබ (නො)දන්න මම

"පහුගිය අවුරුදු අටටම මගේ නොට්පේඩ් නෑ...."

ඉංදික දොරකුඹුර

ජ්‍යෙෂ්ඨ ණය විධායක - ක්ෂුද්‍ර මූල්‍ය හැටන් සේවා මධ්‍යස්ථානය

සම්පූර්ණ නම :- ඉංදික පුෂ්ප කුමාර දොරකුඹුර
උපන් දිනය (කැමති නම) :- 1983.06.26
පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම පාසැල :- මගේ ගම ගිනිගත්හේනේ හෝමාගම, ඒක ගිනිගත්හේනේ ඉඳලා කි.මී. 25 - 30 විතර දුරින් පිහිටි හද්දා පිටිසර දුෂ්කර ගමක්. ඒ ගමට නුදුරින් තිබුණු කැළණිගම මහා විද්‍යාලයට තමයි මම මුලින්ම ඉස්කෝලෙ ගියේ. ඒ ඉස්කෝලෙට මම ගියේ 3 පංතියට වෙනකම් විතරයි.එයින් පස්සේ ගිනිගත්හේන මධ්‍ය මහා විද්‍යාලයට ඇතුල් වුණා. ගිනිගත්හේනෙ ඉස්කෝලෙට යද්දි උදේට හැතැප්ම 10 පයින් ගිහින් එතැනින් බස් එකේ ගිනිගත්හේනට යනවා. හවසට ඒ බස් එකත් නෑ.ඉතින් ඒ කි.මී. 25 -30 බඩගින්නෙ පයින් ගෙදර එද්දි හවස හතර හතරහමාර පහුවෙනවා. ඒ විදිහට මම උසස්පෙළ වෙනතුරු මම ඉගෙන ගත්තෙ ඒ ඉස්කෝලෙ. උසස්පෙළට මම තෝරාගත්තේ වාණිජ විෂයයන්. නොසෑහෙන්න දුක් විඳලත් මම ගිනිගත්හේන විද්‍යාලයට ගිය ඒ කාලයට කැමතියි. මොකද මගේ ජීවිතේට පදනමක් වැටුණෙ. මගේ දක්ෂතා එළියට ආවේ ඒ ඉස්කෝලෙදි.
විෂය :- ගණිතයට
ක්‍රීඩාව :- මීටර් 100 දිව්වා. ජයග්‍රහනත් ලබලා තියෙනවා.
පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ :- මගේ තාත්තා අපිට ඉගැන්නුවෙ මේසන් වැඩ කරලා බොහොම අගහිඟකම්මැද්දෙ. අපේ පවුලෙ මට අයියලා තුන්දෙනයි අක්කයි ඉන්නේ. පුංචි කාලේ මගේ තිබුණු හීනය වුනේ කවදා හරි දොස්තර කෙනෙක් වෙනවා කියන එක. මගේ අයියලා දෙන්නෙකුයි අක්කයි කැම්පස් තේරුණා. මගෙත් ඉන් පස්සෙ ආශාව වුණේ කැම්පස් යන්න. මගේ ගණිතයට තිබුණු කැමැත්තයි අයියලගෙ කීමටයි මම වාණිජ විෂයයන් වලින් උසස් පෙළ කළා. දෙපාරක් උසස්පෙළ විභාගෙට පෙනී හිටියත් කැම්පස් යන්න තරම් ලකුණු ගන්න මට බැරිවුණා.
මුල්ම රැකියාව සහ වඩාත්ම ආශාවෙන් කළ රැකියාව :- මම මුලින්ම රස්සාව විදිහට කළේ ඩිරෙක්ට් මාකටින් ජොබ් එකක්. අපි ගෙයින් ගෙට ගිහින් බඩු විකුණුවා. ඒ රැකියාවේ කළමනාකරුවකු දක්වා ඉහළට එන්න පුළුවන් වුනේ මට දීපු ටාගට් දුන්නු කාලයට මාස කිහිපයකට කලින්ම සම්පූර්ණ කරන්න පුළුවන් වීම නිසයි. ඒ ආයතනයේ අවුරුදු එකහමාරකට වඩා මම හිටියේ නෑ. එතැනින් අයින් වෙලා අපි හතර දෙනෙක් එක්ක වෙනම ඩිරෙක්ට් මාකටින් කළා.ඒ අතරෙ තමයි පත්තරේ ඇඩ් එකක් දැකලා ග්‍රාමි..ගගන් එකේ රස්සාවට ආවේ.ඒ රස්සාවට දාන්න මාව උනන්දු කළේ මම යාළු වෙලා හිටපු ගෑණු ළමයා.2008 අවුරුද්දෙ ක්ෂේත්‍ර නිළධාරියෙක් විදිහටයි මම මේ රස්සාවට ආවේ.මෙතෙක් කරපු හැම රස්සාවකටම වඩා මම ග්‍රාමින් එකේ මේ රැකියාවට කැමතියි.
ජීවිතේ අමතක නොවන සිද්ධිය :- පත්තරෙන් ග්‍රාමින් එක ගැන දැනගෙන කොතලාවල සර්ට ලියුමක් දාලා ග්‍රාමින් එකේ රස්සාවක් ඉල්ලමු කියන යෝජනාව මට කළේ මගේ පෙම්වතිය. ඒ ලියුමෙ ප්‍රතිඵලයක් විදිහට තමයි ග්‍රාමින් එකෙන් මට ඉන්ටර්වීව් එන්න කියලා ලියුමක් ලැබුණෙ. බණ්ඩාරවෙලින් මහ රෑ බස් එකේ නැගලා පහුවෙනිදා උදේ ඉන්ටර්වීව් ආපු ඒ ගමන මට කවදාවත් අමතක වෙන්නේ නෑ. මොකද ඒක ජීවිතේ තීරණාත්මක ගමනක්.
ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය :- 2016 අප්‍රේල් 30 වෙනිදා. **HNB** ග්‍රාමින් එකට ඇවිත් ලබපු ලොකුම සම්මානය තමයි මම එදා ලැබුවේ.මීට පෙර අවස්ථා දෙකකදි ප්‍රාදේශිකයේ හොඳම ක්ෂේත්‍ර නිළධාරියා වෙන්න මට පුළුවන් වුණා. මගේ ඊළඟ ඉලක්කය වුණේ සමස්ත දිවයිනෙන්ම හොඳම ක්ෂේත්‍ර නිළධාරියා වීම ඒ අරමුණ මේ වසරෙ ඉෂ්ට වුණා.
අරමුණක් කරා යාමේදී ඔබ අනුගමනය කරන්නේ :- මම හිතරම අරමුණක් ඇතිව වැඩ කරන කෙනෙක්. හිතට මොකක් හරි අරමුණක් ආවොත් මම ඒ අරමුණ සඵල වෙනතම් මගේ උත්සාහය අත්හරින්නෙ නෑ.අනිත මම වැඩ කරද්දි මා එක්ක ඉන්න අයිත් අය මොතවද කරන්න කියලා මම ගොයන්නෙ නෑ. බොහොමයක් වෙලාවට අයිත් කෙනාගෙ ටාගට් එකත් මම කරන අවස්ථා තියෙනවා. මම හිතන්න ඊක මට ලැබුණු අවස්ථාවක් කියලා. පහුගිය අවුරුදු අටටම මගේ නොට්පේඩ් නෑ.
අතීතයට යාමට වරමක් ලැබුණොත් ඔබ තෝරාගන්නා ජීවිතේ හොඳම කාලය සහ ඊට හේතුව :- උසස්පෙළ ඉගෙන ගත්තු කාලයට. මට අහිමි වුණු සරසවි සිහිනයට යන්න නැවත මට උත්සාහ කරන්න තිබුණා.

ජීවිතයට අහිමි වුණු වටිනාම පුද්ගලයා හෝ අවස්ථාව :- 2011 දි මම ප්‍රාදේශීය සභා ඡන්දයට ඉදිරිපත් වුණා.මනාප පොඩි ගාණක් මදිවෙලා ඒ ඡන්දෙන් මම පැරදුණා. මගේ දේශපාලන ඉලක්කය කරා යන ගමන ඒකෙන් තරමක් පමාවුණා
හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා :- මට ටිකක් විතර තරහා යනවා. ඉලක්කයන් කරා යද්දි එන ගැටළු වලදි මගේ හිත නොසන්සුන් වෙනවා ඒ ගතිය අඩුකර ගන්න ඕන
ඔබ හිතන විදිහට ඔබ වඩාත්ම කුසලතාවන් ප්‍රකට කරන්නේ:- ක්ෂේත්‍රය තුළ කරන වැඩ වලට තමයි මගේ වැඩි හැකියාවක් තියෙන්නෙ.
ඔබේ ජීවිතයේදී හමුවූ වඩාත්ම ආකර්ශනීය පුද්ගලයා, ඔහුතුළ ඔබ දකින සුවිශේෂීතාවය :- මගේ අම්මා. ඇය තමන්ගෙ දරුවො තැනකට ගන්න හුගක් දුක් විඳ ඩෙඩියවන්ත මවක්.
පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම :- බණ්ඩාරවෙල සේල් සෙන්ටර් එකේ වැඩ කරන කාලෙදි ගෑණු ළමයෙක් ඒකේ වැඩට ඉන්ටර්විව් ආවා. ඒ වෙද්දි අපි ගෑණු ළමයින්ව වැඩට ගන්නෙ නෑ. ඒත් මම එයාගෙ ඇප්ලිකේශන් එක ඉල්ලන් බලද්දි එයාගෙ උපන් දිනෙත් මගේ උපන් දිනෙත් එකයි . අවුරුද්ද විතරයි වෙනස්. පස්සෙ ඇප්ලිකේශන් එකේ තිබුණු අංකයට කෝල් එකක් ගත්තා. ඒ දුරකථන ඇමතුම් ටික කාලෙකින්ම ආදර සංවාද බවට පත් වුණා. දැන් අවුරුදු 11 හිස්සේ ඒ ආදරය ගලාගෙන යනවා. ලබන අවුරුද්දෙ බදින්න හිතාගෙන ඉන්නවා.
එම පුද්ගලයාගේ ඔබ දකින සුවිශේෂතාව :- එයා කොෂල්‍යා ඇංජානා, පුංචි ළමයෙක් වගේ සැහැල්ලුවෙන් ජීවිතය විඳිනවා
ඔබ ඔබේ ජීවිතය ගැන තෘප්තිමත්ද :- අනිවාර්යයෙන්ම, මම මේ වෙද්දි මගේ ජීවිතයේ පියවර ගණනාවක් ඉදිරියට ඇවිත් තියෙනවා. ඩිරෙක්ට් මාර්කටින් කරන කාලේ මම අව්වෙ හැතැප්ම ගණන් පයින් ගියා. මේක ආත්ම ගෞරවයක් ඇතිව හුගක් සමාජ අත්දැකීම් ලබමින් ඉදිරියට යන්න පුළුවන් රැකියාවක්. ඇත්තෙන්ම මම මගේ ජීවිතය ගැන තෘප්තිමත්.
ඔබේ ජීවිතය වෙනස් කළ හැරවුම් ලක්ෂ්‍යය (turning Point) :- 2008 ජනවාරි වල මම එතෙක් කරමින් උන්නු රැකියාවෙන් ඉවත්වෙලා ග්‍රාමින් සමාගමේ රැකියාවට ඒමට ගත්තු තීරණය.
ඔබේ ප්‍රියතම ගායකයා :- රයිනි චාරුකා
ගීතය :- නොබලා මා දිහා බලා
චිත්‍රපටිය :- ත්‍රාසජනක චිත්‍රපටි කොයිකත් බලන්න කැමතියි
කෘතිය :- ෂර්ලොක් හෝම්ස් ගේ රහස් පරීක්ෂක කතා
අනාගත ඉලක්කය :- මට දැන් පෙරටත් වඩා වගකීම් වැඩියි. මගේ රැකියාවේ අභියෝග වලට සාර්ථකව මුහුණ දීලා කවදා හරි ශාඛා කළමනාකරුවෙකුගෙ තැනට උසස් වීමේ ඉලක්කයක් මට තියෙනවා.

සටහන
මංජුල හෙට්ටිආරච්චි

Atlas

සිත්තර යාළු

පුංචි අපේ චිත්‍ර පිටුව

''සිත්තර යාළු'' චිත්‍ර පිටුව වෙන්වෙලා තියෙන්නේ එච් එන් බී ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ ඔබේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළි දැක්වීම පිණිසයි. ''සිත්තර යාළු චිත්‍ර පිටුවෙහි පළවන චිත්‍ර අතරින් **තෝරා ගනු ලබන හොඳම චිත්‍ර තුනක් සඳහා සිලෝන් පෙන්සිල් කොම්පැණි (ඇට්ලස්) මගින් පිරිනමනු ලබන වටිනා තෑගි කට්ටල තුනක් පිරිනමනු ලබන** අතර ඔබගේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළිදක්වාලීමට ලැබෙන මේ මාහැඟි අවස්ථාව ප්‍රයෝජනයට ගෙන **ඔබේ දරුවාගේ චිත්‍ර නිර්මාණ සංස්කාරක, චිත්‍ර පිටුව, එච් එන් බී ග්‍රාමීන් ගොඩනැගිල්ල, අංක 168, නාවල පාර , නුගේගොඩ. යන ලිපිනයට නොපමාව යොමු කරන්න.**

දහම් රත්නසේකර අවුරුදු 4
(දිනේෂ් රත්නසේකර - ප්‍රධාන කාර්යාලය)

වෙසක් දා අපේ ගෙදර
එච්.ඒ කේමිත අබේවික්‍රම - 3 ශ්‍රේණිය
(සුරංග අබේවික්‍රම H/O - FD)

මගේ අනාගත සිහිනය
එම්.ටී උතුල් බුද්ධිම තන්ත්‍රිගේ - 2 ශ්‍රේණිය
(බුද්ධිම තන්ත්‍රිගේ - ප්‍රධාන කාර්යාලය)

අපේ ගම
සහස් රනුලක දිසානායක - අවුරුදු 5
(තිළිණ දිසානායක - ප්‍රධාන කාර්යාලය)



පුංචි පවුල
එච්.එම් ලසිනි මේධාවි ආදිත්‍යා - පෙර පාසල
(සුරංග හේරත් - කළමනාකරු නගර ශාඛාව)

අසරණ අයට පිහිටවීම
සදුප රණවීර - 2 ශ්‍රේණිය
(කමල් ප්‍රියංග - ප්‍රධාන කාර්යාලය)



ගංගාවක් ගලා බසී
ඊ. සහේලි සහස්නා දහම්දි - 3 ශ්‍රේණිය
(සුජිත් කුමාර - ප්‍රාදේශීය කළමනාකරු)



අපේ ගමේ අවුරුදු උත්සවය
නිකේෂ පැතුමංග - 2 ශ්‍රේණිය
(රුවන් ප්‍රනාන්දු මහතා - ප්‍රධාන කාර්යාලය)

ආදිත්‍යා සුරක්ෂි - පෙර පාසල
(කේ.එල් එරාජ් - ප්‍රාදේශීය කළමනාකරු
පුත්තලම ශාඛාව)

මගේ මාලු ටැංකිය
ආර්.එම් ඉමේන් මනුජය රත්නායක - පෙර පාසල
(ආර්.එම් නිලන්ත කුමාර රත්නායක
සහකාර කළමනාකරු ගල්ගමුව ශාඛාව)

"Atlas සිත්තර යාළු"
(මාර්තු - අප්‍රේල් කලාපයේ)
ජයග්‍රාහී දූ පුතුන්

- පළතුරු වත්ත
  මල්මී කාව්‍යා
- මගේ නංගී ගෙදර ආව දවස
  එම්.ටී උතුල් බුද්ධිම
- මා දුටු නැවක්
  විදුෂි චමත්කා ජයවීර

ක්‍රම හා උපක්‍රම සොයා ගෙන වැඩ කළ යුතුය

වෙනත් සෑම වසරක සේම මේ වසරේද අළුත් අවුරුදු ගනුදෙනු සඳහා **HNB** ග්‍රාමීන් ෆයිනෑන්ස් ලිමිටඩ්හි සියළුම ශාඛා අප්‍රේල් 15 වෙනි සිකුරාදා විවෘත කර තිබුණි. අළුත් අවුරුද්දෙ තම පළමු ගනුදෙනුව **HNB** ග්‍රාමීන් සමග ආරඹන්නට සපැමිණි ගනුදෙනුකරුවන් සඳහා ඉතා වටිනා ත්‍යාගයන් පිරිනැමුණු අතර **HNB** ග්‍රාමීන් ෆයිනෑන්ස් ලිමිටඩ් මගින් **HNB** ග්‍රාමීන් ඉතුරුම් ගිණුම, යාළු (ළමා)ඉතුරුම් ගිණුම, පිරිපුන් (ජ්‍යේෂ්ඨ පුරවැසි) ඉතුරුම් ගිණුම වැනි ඉතුරුම් ගිණුම් රැසක් හඳුන්වා දී ඇත. **HNB** ග්‍රාමීන් සමාගම සිය ඉතුරුම් ගිණුම් සඳහා තරගකාරී පොළී අනුපාතයක් ලබාදෙන්නා සේම විශ්වාසදායී සුරක්ෂිත ආයෝජනයක තෘප්තියද සිය ගනුදෙනුකරුවන් වෙනුවෙන් ලබාදීමට කැප වූ කීර්තිමත් මූල්‍ය සමාගමකි.

වවුනියාවේ දුෂ්කර පාසැල් දෙකකට HNB ග්‍රාමීන් අනුග්‍රහය

වවුනියාව ඕමන්තෙහි පිහිටි අඩු පහසුකම් සහිත පාසැල් දෙකක් වෙත **HNB** ග්‍රාමීන් සමාජ සත්කාරක ව්‍යාපෘතිය යටතේ විශේෂ පහසුකම් සැපයීමක් පසුගිය මාර්තු 28 දින සිදු කරන ලදි. මෙහිදී කෝවිල් කුන්චිකුලම් රජයේ දෙමළ මිශ්‍ර පාසැලට ජල පිරිපහදු කිරීමේ උපකරණයක් සවිකොට දී ජලය ලබාදීමත්, විදුලි බල පහසුකම් සපයාදීමත් සිසු දරු දැරියන් උදෙසා පොත් පාර්සල් ලබා දීමත් සිදු කරන ලදි.

පාලමෝට්ටයි රජයේ දෙමළ මිශ්‍ර පාසැලෙහි ගොඩනැගිල්ල අළුත් වැඩියා කර දීමත් පාසැලේ දරු දැරියන් සඳහා පොත් පාර්සල්, පාසැල් බෑග්, සපත්තු ආදි පාසැල් උපකරණ ලබා දීමත් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදි. මෙම අවස්ථාවට **HNB** ග්‍රාමීන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රහාත් මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ශාඛා ජාල, ඇනස්ලි ප්‍රනාන්දු සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් වන මහින්ද රත්නායක, පැතුම් සම්පත් කුරේ යන මහත්වරුන් සෙසු ආරාධිතයන් ලෙස මේ අවස්ථාවට එක්වූහ.

HNB GRAMEEN මෙහෙවර

එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර
නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් : 0112825843
ඊ-මේල් :- manjula.p@hnbgrameen.lk
වෙබ් :- www.hnbgrameen.com

අධික්ෂණය :- චමින්ද ප්‍රහාත්
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රහාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- චාමර සම්පත්
ඡායාරූප ශිල්පී :- ලක්ෂ්මන් කුමාරතුංග

birthday Happy

ජූනි මාසයේ උපන්දිනය සමරන එච් එන් බී ග්‍රාමීන් සමාගමේ සහෝදර සේවක මහත්ම මහත්මීන් වෙත අපගේ හෘදයාංගම සුබ පැතුම් මේ සමග පිහිනමමු!

නම	දිනය	ශාඛාව
කපිල ධර්මසේන මහතා	ජූනි 01	අවිස්සාවේල්ල
ශමිනි තාරිකා මෙනෙවිය	ජූනි 01	ප්‍රධාන කාර්යාලය
සාමිත දර්ශන මහතා	ජූනි 01	කළුතර
කුෂාන්ත චමින්ද මහතා	ජූනි 02	වැලිමඩ
සනත් ප්‍රියංකර මහතා	ජූනි 02	අනුරාධපුර
මධුශංක වැකඩපොල මහතා	ජූනි 02	නුවර
ඩිලාන් චමිලික මහතා	ජූනි 02	හොරණ
නිලීණා ප්‍රියංකර මහතා	ජූනි 03	බෙලිඅත්ත
අරවින්ද අකලංක මහතා	ජූනි 04	අම්පාර
රුවන් මංජුල මහතා	ජූනි 04	හොරොව්වෝල
සංජීව පුදීප් මහතා	ජූනි 05	පදවිය
නිරෝෂන් හේරත් මහතා	ජූනි 06	නගර ශාඛාව
එස්. දිලුක්ෂාන් මහතා	ජූනි 06	කිලිනොච්චිය
එන් මේගරාජා මහතා	ජූනි 06	මඩකලපුව
ජයසීලන් රූපන් මහතා	ජූනි 06	කිලිනොච්චි
නුවන් සංජීව මහතා	ජූනි 07	ගලෙන්බිදුණුවැව
චතුරිකා මධුෂානි මෙනෙවිය	ජූනි 07	ප්‍රධාන කාර්යාලය
සම්පත් කුමාර මහතා	ජූනි 07	බෙලිඅත්ත
ලහිරු බණ්ඩාර මහතා	ජූනි 07	කුරුණෑගල
ලක්ෂ්මන් එරාජ් මහතා	ජූනි 08	ප්‍රධාන කාර්යාලය
ඩබ්. පී. සුරංග මහතා	ජූනි 08	මීගමුව
නුවන් ඉන්දික මහතා	ජූනි 08	හොරණ
නුවන් ප්‍රදීප් මහතා	ජූනි 08	මොරවක
එම්. ජෙයදර්ශන් මහතා	ජූනි 09	තිකුණාමලය
ප්‍රදීප් කුමාර මහතා	ජූනි 09	මොනරාගල
ඩිලාන් උපේන්ද්‍ර මහතා	ජූනි 09	කළුතර
කේ. රාසයියා මහතා	ජූනි 09	හෙල්ලිඇඩ්
ගමගේ චතුර මහතා	ජූනි 09	ගාල්ල
කේ ශ්‍රීධරන් මහතා	ජූනි 10	වවුනියා
ඇන්ටන් වෝල්ටා මහතා	ජූනි 10	හොරොව්වෝල
යෝගනාදන් සුදේශන් මහතා	ජූනි 10	මඩකලපුව
සමීර මධුශංක මහතා	ජූනි 10	තිකුණාමලය
දීපාල් සංජීව මහතා	ජූනි 10	ඇඹිලිපිටිය
සුනිල් පෙරේරා මහතා	ජූනි 11	හොරණ
මහේෂ් සජීවන් මහතා	ජූනි 11	වත්තල
මහේෂ් කුමාර මහතා	ජූනි 11	මාතර
සමන් කුමාර මහතා	ජූනි 11	පදවිය
නලින් මධුශාන් මහතා	ජූනි 11	මොනරාගල
ෆ්‍රැන්ක්ලින් ඇන්තනී මහතා	ජූනි 11	ප්‍රධාන කාර්යාලය
එරංද ශ්‍රී ප්‍රියංග මහතා	ජූනි 12	මාතලේ
සංජීව පුදීප් මහතා	ජූනි 12	බදුල්ල
නිරංජන් සෙනරත් මහතා	ජූනි 13	රිකිල්ලගස්කඩ
චමින්ද ප්‍රියංකර මහතා	ජූනි 14	මොරටුව
දිනේෂ් රුවන් කුමාර මහතා	ජූනි 14	බෙලිඅත්ත
සංජය බණ්ඩාර මහතා	ජූනි 14	මාතලේ
චින්තන සුවේෂ් කුමාර මහතා	ජූනි 14	කුරුණෑගල
අසිත් ප්‍රසන්න මහතා	ජූනි 15	මොනරාගල
ටී තවනේෂ්වරන් මහතා	ජූනි 15	අම්පාර
ශාලික රසිත් මහතා	ජූනි 15	අවිස්සාවේල්ල
දිශාන් කල්හාර මහතා	ජූනි 15	බණ්ඩාරගම
චමින්ද පුෂ්පකුමාර මහතා	ජූනි 16	ප්‍රධාන කාර්යාලය
ඩිෂාන් චමින්ද මහතා	ජූනි 16	ප්‍රධාන කාර්යාලය
ගිහාන් බණ්ඩාර මහතා	ජූනි 16	බලන්ගොඩ
අමිත් මධුශාන් මහතා	ජූනි 16	රිකිල්ලගස්කඩ
නන්දන ජයලත් මහතා	ජූනි 17	හලාවත
චාමර ලක්මාල් මහතා	ජූනි 17	මතුගම
ප්‍රලෝගනාදත් ඩිලක්ෂන්	ජූනි 18	මන්නාරම
මලික් මොහොමඩ් මහතා	ජූනි 19	අනුරාධපුර
ඉශාන් මතීෂ මහතා	ජූනි 19	මොරටුව
සුසිල් දාබරේ මහතා	ජූනි 19	හලාවත
රංජන් ධර්මකීර්ති මහතා	ජූනි 20	පුත්තලම්
මොහොමඩ් ඉස්මත් මහතා	ජූනි 20	අම්පාර
රුවන් කිත්සිරි මහතා	ජූනි 20	ගල්ගමුව
නුවන් සාගර මහතා	ජූනි 21	මාතර
දමිත් ඉශාර මහතා	ජූනි 21	ගාල්ල
සමන් කුමාර සෙනෙවිරත්න මහතා	ජූනි 21	මදෙව්චිය
දමිත් හරිනිදික මහතා	ජූනි 21	බෙලිඅත්ත
සමීර සම්පත් මහතා	ජූනි 21	අම්පාර
නිලාන් අනුරුද්ධ මහතා	ජූනි 22	මාතර
තිලිමාල් සෙනෙවිරත්න මහතා	ජූනි 22	ප්‍රධාන කාර්යාලය
කෝලේගෙදර ප්‍රියන්ත මහතා	ජූනි 22	නාවලපිටිය
රාසරත්නම් ප්‍රභාන්ත් මහතා	ජූනි 22	තිකුණාමලය
කේ.නිරෝව් මහතා	ජූනි 22	වවුනියාව
සමීර ගයාන් හේරත් මහතා	ජූනි 23	ප්‍රධාන කාර්යාලය
දර්ශික නිරෝශන් මහතා	ජූනි 23	ප්‍රධාන කාර්යාලය
පිලිප් හෝමර් මහතා	ජූනි 24	මන්නාරම
ප්‍රදීප් නිලීත කුමාර මහතා	ජූනි 24	අනුරාධපුර
එස් විනෝද්දන් මහතා	ජූනි 25	හෙල්ලිඇඩ්
දුමින්ද ජයවීර මහතා	ජූනි 25	බණ්ඩාරගම
විසන්ත රංජිත් මහතා	ජූනි 25	වැලිමඩ
එරංග පුෂ්පනාත් මහතා	ජූනි 26	ප්‍රධාන කාර්යාලය
ඉංදික පුෂ්පකුමාර මහතා	ජූනි 26	හැටන්
තවරාජා අනෝජන් මහතා	ජූනි 26	පොතුවිල්
තරිදු ප්‍රියසංඛ මහතා	ජූනි 26	දඹුල්ල
ජනිත් සංජය මහතා	ජූනි 26	බණ්ඩාරගම
රුබේරු ජයතුංග මහතා	ජූනි 27	ප්‍රධාන කාර්යාලය
ජනංජය බණ්ඩාර මහතා	ජූනි 27	නුවර
තාරුක ජීවන්ත මහතා	ජූනි 27	මතුගම
දශිකා නුවන්ති මෙනෙවිය	ජූනි 28	නගර ශාඛාව
චානක කසුන් මහතා	ජූනි 28	කුරුණෑගල
ජේ අබිරාමි මෙනෙවිය	ජූනි 28	යාපනය
රංගන මල්ලවාරච්චි මහතා	ජූනි 29	ප්‍රධාන කාර්යාලය
සුපිත් ප්‍රසන්න මහතා	ජූනි 29	කුලියාපිටිය
උපුල් කුමාර මහතා	ජූනි 29	කැගල්ල
කුමාර් ද්‍රවීශන් මහතා	ජූනි 29	මන්නාරම
එල්. ආනන්දරාජ් මහතා	ජූනි 29	තිකුණාමලය
සුමිත් චාමර මහතා	ජූනි 30	ඇඹිලිපිටිය
උදය බණ්ඩාර මහතා	ජූනි 30	ප්‍රධාන කාර්යාලය
ඩිවමණි කුෂාන්තන් මහතා	ජූනි 30	මොනරාගල